# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 57 — 1973 අප්‍රේල් 27 වැනි සිකුරාද — 1973.04.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 423 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 437 |
| සභාතුරු—ඇබෑර්තු ... ... ... | 428 | අය-වැය ලේඛන ... ... ... | 441 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 431 | දේපල විකිණීම ... ... ... | 441 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 432 | මාර්ග කොමිටි දන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දන්වීම ... | — | විවිධ දන්වීම ... ... ... | 442 |


## පළාත් පාලන නිවේදන

කදාන සුළු නගර සභාව

ප්‍රසිද්ධ රහ දක්වීම් ආඥාපනත

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රහ දන්වීම් ආඥාපනතේ 3 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවන ලද රීතිය.

1973 අප්‍රේල් 9 වැනි දින,
කොළඹ දී ය.

පීලික්ස්. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු ඇමති.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. ශථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන් ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දන්වීම් භාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 ජනවාරි මස 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

### රීතිය

(176 වන අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ සම්පාදිතව 1919 අප්‍රේල් මස 4 වන දින අංක 7004 දරණ ගැසට් පත්‍රයේ පලකරනු ලැබූ 1971 පෙබරවාරි මස 26 වන දින අංක 14,947 දරණ රීතියෙන් අන්තිම වරට සංශෝධිත රීති, කඳාන සුළු නගර සභාවේ පාලන සීමාව ඇතුළතවූ පාලන ප්‍රදේශයට අදාල වන පමණට එහි (අ) 3 වැනි රීතියේ දක්වා ඇති ගාස්තු ක්‍රමය වෙනුවට පහත සඳහන් අළුත් ගාස්තු ක්‍රමය ආදේශ කිරීමෙන් මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

| | දින 9ට වැඩි නොවන කාලයකට ගාස්තු රු. ශ. | දින 9ට වැඩි එහෙත් මාස 1ට වැඩි නොවන කාලයකට ගාස්තු රු. ශ. | මාස 1 සිට මාස 6 දක්වා ගාස්තු රු. ශ. | මාස 6 සිට මාස 10 දක්වා ගාස්තු රු. ශ. | මාස 10 සිට අවුරුද්ද දක්වා ගාස්තු රු. ශ. |
|---|---|---|---|---|---|
| වාඩිවීමට සපයා ඇති ආසන සංඛ්‍යාව 299ට වැඩි නොවන විට ... | 5 0 ... | 25 0 ... | 50 0 ... | 100 0 ... | 150 0 |
| වාඩිවීමට සපයා ඇති ආසන සංඛ්‍යාව 299ට වැඩි නමුත් 399ට වැඩි නොවන විට ... ... ... ... | 8 0 ... | 50 0 ... | 100 0 ... | 150 0 ... | 225 0 |
| වාඩිවීමට සපයා ඇති ආසන සංඛ්‍යාව 399ට වැඩි නමුත් 499ට වැඩි නොවන විට ... ... ... ... | 10 0 ... | 75 0 ... | 150 0 ... | 225 0 ... | 300 0 |
| වාඩිවීමට සපයා ඇති ආසන සංඛ්‍යාව 499ට වැඩිවන විට ... | 15 0 ... | 150 0 ... | 225 0 ... | 300 0 ... | 400 0 |

4–704 - 73.04.27 දින අංක 57 දරන ගැසට් පත්‍රය

---

### නගර හා ග්‍රාම නාම වෙනස් කිරීම

මෙහි පහත සඳහන් පළමුවැනි උපලේඛනයේ ඇති ග්‍රාම නාමය දෙවන උප ලේඛනය ප්‍රකාරව වෙනස් කරන්නට යෙදුන බව පොදු දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

පිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

1973 අප්‍රේල් මස 4 වැනි දින,
කොළඹ 7,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ දී ය.

| දිස්ත්‍රික්කය | පළමුවැනි උපලේඛනය | දෙවැනි උපලේඛනය |
|---|---|---|
| මාතලේ ... | පුරිජ්ජල හේනේගම ... | එගොඩ පුරිජ්ජල |

4—658—73.04.27 දින අංක 57 දරන ගැසට් පත්‍රය

---

### විදුලිබල පනත

වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග ඇමතිතුමාගෙන් විමසා රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් දෙන ලද අනුමැතිය ඇතිව කොළඹ දිස්ත්‍රික්කයේ කටාන ගම්සභාව විසින් 1957 අංක 59 දරණ පනතින් සංශෝධිත (205 වන අධිකාරය වන) විදුලි බල ආඥාපනතේ 46 වැනි වගන්තිය යටතේ සම්පාදිත වූ නියෝග.

ගා. බෙ. වික්‍රමනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973.04.05.
කොළඹ දී ය.

#### නියෝග

1. මේ නියෝගවල—

"පනත" යනුවෙන් 1957 අංක 59 දරන පනතින් සංශෝධිත (205 වැනි අධිකාරය වන) විදුලි බල පනත අදහස් කරනු ලැබේ.

"බලපත්‍රය" යනුවෙන් පනතේ 2 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ කටාන ගම්සභාව වෙත නිකුත් කරන ලද බලපත්‍රය අදහස් කරනු ලැබේ.

"බලපත්‍රලාභියා" යනුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ කටාන ගම් සභාව අදහස් කරනු ලැබේ.

2. තම ප්‍රයෝජනය පිණිස බලපත්‍රලාභියාගෙන් විදුලි බලය ලබා ගැනීමට බලාපොරොත්තු වන යම් කෙනකු විසින්—

(අ) විදුලි බලය ලබා ගැනීමට ඕනෑ කරන දින සිට යටත් පිරිසෙයින් දවස් දහ හතරකට මත්තෙන් ඒ සඳහා බලපත්‍රලාභියා විසින් සපයනු ලබන ආකෘතිපත්‍රයෙහි පිළියෙළ කළ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය; තවද

(ආ) විද්‍යුත් වේගවාහක කේබල් කම්බිය සඳහා ගාස්තු බලධාරියා වෙත කලින් ගෙවීම, හෝ බලපත්‍රලාභියා එසේ නියම කරන්නේ නම් ආඥාපනතේ 33 වැනි වගන්තිය යටතේ බලපත්‍රලාභියා සමග ලිඛිත ගිවිසුමකට ඇතුළත් වීම කළ යුතුය.

3. (අ) බලපත්‍රලාභියාගේ විද්‍යුත් වේගවාහක ප්‍රධාන කම්බියට සම්බන්ධ කිරීමට අදහස් කෙරෙන විදුලි බල සංස්ථාපනයක කම්බි ඇදීම පාරිභෝගිකයා විසින් කම්බි ඇදීම පිළිබඳව ඉංජිනේරු ආයතනය විසින් නියම කරනු ලැබූ නියෝග වලට අනුව කටයුතු කල හැකි සෑම සමාගමකට හෝ පුද්ගලයකුට පැවරිය යුතුය. බලපත්‍රලාභියා විසින් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් ඒ කර්මාන්තය පරීක්ෂාකොට අත්හදා බැලීමෙන් හා කම්බි ඇදීම පිළිබඳ ඉහත කී නියෝග අනුව ඒ කර්මාන්තය නිම කර ඇත්තේ යයි බලපත්‍රලාභියා සෑහීමට පත්වූවාට පසු පමණක් එබඳු සංස්ථාපනයකට විදුලි බලය සැපයිය හැකිය.

(ආ) සංස්ථාපනය එකී නියෝග වලට අනුකූල නොවන්නේ නම්, ඒ සංස්ථාපනය ඒ නියෝගවලට අනුකූලව සකස් කරනු ලබන තුරු ඒ ස්ථානයට විදුලි බලය නොදිය යුතුය.

4. විදුලි බලය පාවිච්චි කරන සෑම පාරිභෝගිකයකු විසින් ම බල පත්‍රයේ සඳහන් කරන ලද ප්‍රමාණ අනුව ඒ විදුලි බලය සඳහා මුදල් ගෙවිය යුතු ය.

5. (අ) පාරිභෝගිකයාට අයත් භූමියෙහි පිහිටුවා තිබෙන විද්‍යුත් වේගවාහක කම්බියේ කොටස, විදුලි බල පරිවර්තක, ප්‍රධාන ගිනි නූල්, විද්‍යුත් මාපකය සහ විදුලි යතුරු පුවරු ද බලපත්‍රධාරියා සතු දේපල වශයෙන් පැවතිය යුතු අතර, බලපත්‍රලාභියාගේ බලය පවරනු ලැබූ සේවකයකු විසින් හැර වෙන යම් කෙනෙකු විසින් කුමනාකාර කාරණයක් සඳහාවත් ඒවා, වෙනස් කිරීම හෝ අතපත ගෑම හෝ නොකළ යුතුය.

(ආ) බලපත්‍රලාභියාගේ ප්‍රධාන ගිනි නූලේ හෝ මීටරයේ සිට ස්වකීය පාර්ශ්වයේ ඇත්තාවූ කම්බි, කේබල් කම්බි හා උපකරණ නඩත්තු කිරීම ගැන පාරිභෝගිකයා විසින් වගකිව යුතුය.

(ඇ) ආඥාපනතේ 47 (3) වැනි වගන්තිය යටතේ අසම්බන්ධ කරන ලද විදුලි බල සංස්ථාපනයක් නැවත සම්බන්ධ කිරීමේදී එය සෝදිසි කර බැලීම හා නැවත සම්බන්ධ කිරීම සඳහා බලපත්‍රයෙහි විධිවිධාන සලසා ඇති පරිදි උචිත ගාස්තුවක් අය කළ යුතු අතර පාරිභෝගිකයා විසින් කලින් ගෙවිය යුතුය.

(ඈ) යම් පාරිභෝගිකයකුගේ විදුලි කම්බිවල හෝ උපකරණවල යම් කොටසකින් විදුලි බලය කාන්දුවීමක් සිදු වුවහොත් ස්වකීය ස්ථානයේ පාවිච්චි වූ ලෙස මාපකයේ සටහන් වූ සියලුම විදුලි

### ගෝඝාතක ආඥාපනත

(272 වැනි අධිකාරය වන) ගෝඝාතක ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ නියමිත බලධාරියා විසින්, එනම්, රාගම සුළු නගර සභාව විසින් සම්පාදිතව එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන, ස්වදේශ කටයුතු හා අධිකරණ ඇමතිවරයා විසින් ස්ථිර කරන ලද නියෝග.

ගාමිණී වික්‍රමනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973. 4. 4 දින,
කොළඹ දී ය.

#### නියෝග

1. කිසිම තැනැත්තකු විසින් කිසිම සතකු—

(අ) ඒ සතා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාර පිණිස මරනු ලැබීමට සුදුසු යයි අනුමත කර තිබේනම් මිස, සහ

(ආ) මෙම නියෝගයේ (අ) අනුඡේදය යටතේ ඒ සතා මැරීමට අනුමත කරනු ලැබූ වේලාවෙන් පැය 24 ක කාලසීමාවක් ඉකුත්වී යාමෙන් පසුව යම් අවස්ථාවකදී, සහ

(ඇ) කිසියම් දිනක පූර්ව භාගයේ 7 වත් මධ්‍යහ්න 12 වත් අතර කාලයේ මිස ගෝඝාතක ස්ථානයේදී නොමැරිය යුතුය.

එසේ වුවද, විශේෂ යයි තමා අදහස් කරන අවස්ථාවකදී, මෙහි නිශ්චිතව සඳහන් වේලාවට වඩා වෙනස් වූ යම් වේලාවක යම් සතකු මැරීම සඳහා සභාපති විසින් බලය දිය හැකිය.

2. (1) වැනි නියෝගය යටතේ අනුමත කළ සතකු ගෝඝාතක ස්ථානයට අයිති භූමියෙන් පණ පිටින් ඉවත්කර ඇත්නම්, ඒ සතා නැවතත් පරීක්ෂා කොට මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසු යයි එකී නියෝගය යටතේ අනුමත කරනු ලැබුව හොත් මිස කිසිම තැනැත්තකු විසින් ඒ සතා ගෝඝාතක ස්ථානයේදී නොමැරිය යුතුය.

3. (1) යම් සතකු 1 වැනි නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කළ පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ගේ ආහාරය පිණිස මරණු ලැබීමට නුසුදුසු බව පෙනී ගියහොත් ඒ සතා මැරීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් තහනම් කළ හැකිය.

(2) මෙම නියෝගය යටතේ මැරීම තහනම් කරනු ලැබූ යම් සතකු කිසිම තැනැත්තකු විසින් නොමැරිය යුතුය.

4. ගෝඝාතක ස්ථානයට යම් සතකු ගෙන එන සෑම තැනැත්තකු විසින්ම, ඒ සතා ගෝඝාතක ස්ථානයට අයිති භූමි භාගයෙහි නවත්වා සිටින කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම බීම නිසැකවම ලැබීම සඳහා අවශ්‍ය සියලු විධි විධාන යෙදිය යුතුය.

5. ගෝඝාතක ස්ථානයට යම් සතකු ගෙන එන සෑම තැනැත්තකු විසින්ම, ඒ සතා මරනු ලැබීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂේප කරන ලද්දේ නම්, එසේ ප්‍රතික්ෂේප කළ වහාම ඒ සතා ගෝඝාතක ස්ථානය පිහිටි භූමි භාගයෙන් ඉවත් කළ යුතුය. නැතහොත් ඉවත්කිරීමට සැලැස්විය යුතුය.

6. ගෝඝාතක ස්ථානයේදී මරණ ලද යම් සතකුගේ මස් හෝ මාංශවශේෂ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ මතය අනුව ලෙඩ සහිතව හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුව තිබේනම්, ඒ මස් හෝ මාංශාවශේෂ වෙළඳාම සඳහා විවෘතව තැබීම හෝ මිනිසුන්ගේ ආහාරය වශයෙන් පාවිච්චි කිරීම වැළැක්වීම වස් වහාම විනාශ කර දැමීමට හෝ ඒ පිළිබඳ සුදුස්සක් කිරීමට ඔහු විසින් කටයුතු සැලැස්විය යුතුය. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ විධානය යටතේ මිස කිසිම තැනැත්තකු විසින් එකී මස් හෝ මාංශාවශේෂ ගෝඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

7. මිනිසුන්ගේ ආහාරය පිණිස මරනු ලැබීමට සුදුසු යයි අනුමත කර නැති හෝ 3 වැනි නියෝගය යටතේ මැරීම තහනම් කර ඇති කිසිම සතකු ගෝඝාතක ස්ථානයේදී මස් පිණිස මැරීමට ගෝඝාතක ස්ථානයේ භාරකරු විසින් අවසර නොදිය යුතුය.

8. මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණපයේ ඉස්සරහ ගාත් වලත් පස්සා ගාත් වලත් ගෝඝාතක ස්ථානයේ භාරකරු විසින් "පී. සී. ආර්." යන අකුරු සඳහන් මුද්‍රාව තබා තිබේනම් මිස, කිසිම තැනැත්තකු විසින් ඒ කුණපය ගෝඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

9. වෙන යම් සතකු ඉදිරියේ හෝ ඒ ස්ථානයේ කලින් මරන ලද සෑම සතකුගේම කුණපය ඉවත්කර හෝ මුවාකර හෝ ඒ ස්ථානය පිරිසිදු කරන තුරු කිසිම සතකු නොමැරිය යුතුය.

10. යම්කිසි බෝවන රෝගයකින් හෝ ස්පර්ශයෙන් බෝවන රෝගයකින් හෝ සමේ රෝගයකින් පෙළෙන හෝ ළඟදී පෙළෙමින් සිටි හෝ එබඳු රෝගයකින් පෙළෙමින් සිටි යමකුට මෑතකදී සාත්තු කිරීමෙහි යෙදී සිටි කිසිම තැනැත්තකුට, එකී රෝගය බෝවන හෝ රෝග බීජ මෝරන කාලසීමා ඉකුත්වනතුරු, යම්කිසි ගෝඝාතක ස්ථානයකට ඇතුළුවීමට හෝ මස් පිණිස සතුන් මැරීමේ කටයුතු වල යෙදීමට එම ගෝඝාතක ස්ථානයේ භාරකරු විසින් අවසර නොදිය යුතුය.

11. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා විසින් සුදුසු සියළුම අවස්ථාවලදී ගෝඝාතක ස්ථානයකට ඇතුළුවී එකී ස්ථානය පරීක්ෂාකර බලනු ලැබිම නීත්‍යානුකූල විය යුතු අතර, එම ස්ථානයෙහි භාරකරු විසින් ඔහුට ඒ සඳහා අවශ්‍යවිය හැකි සියලුම ආධාර දිය යුතුය.

12. සභාව විසින් පිහිටුවා ඇති ගෝඝාතක ස්ථානයක් පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් ප්‍රමාණ අනුව වූ ගාස්තුවක් සභාවට කලින් ගෙවිය යුතුය. ගාස්තු ගෙවූ බවට සාක්ෂි වශයෙන් සභා කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් නැතිව කිසිම සතකු නොමැරිය යුතුය :—

| | |
|---|---|
| එක ගවයෙකු සඳහා ... ... | 5.00 |
| එක් එළුවකු සඳහා ... ... | 2.50 |

13. ගෝඝාතක ස්ථානයෙහි මරනු ලබන එක් එක් සතා පිළිබඳ විස්තර ලේඛණයක් සභාව විසින් නියම කළ හැකි ආකාරයකින් සෑම ගෝඝාතක ස්ථානයකම ගෝඝාතක ස්ථාන භාරකරු විසින් පවත්වාගෙන යායුතුය.

14. මෙම නියෝග වලින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා වෙත පවරනු ලබන බලතල, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියාගේ සාමාන්‍ය හෝ විශේෂ නියමය යටතේ ක්‍රියා කරන යම් නිලධාරියෙකු විසින් ක්‍රියාවෙහි යෙදවිය හැකිය.

15. මෙම නියෝගවල—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"සභාව" යනුවෙන් රාගම සුළු නගර සභාව අදහස් වේ.

4—643—73.04.27 දින අංක 57 දරන ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

ගම්සභා ආඥාපණතේ (257 වැනි අධිකාරය) 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, හලාවත-පුත්තලම් දෙදිසාවේ පළාත් පාලන සහකාර කොමසාරිස් ලලිත් හෙට්ටිආරච්චි වන මම හලාවත-පුත්තලම් දෙදිසාවේ ආනවිලුන්දන්පත්තු ගම් සභාවේ අංක 4 දරණ කොට්ඨාශයේ සභික, ඇන්ටනී ජස්ටින් මිරැල් මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභා රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට, තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණීම ගැන සෑහීමකට පත්ව හලාවත-පුත්තලම් දෙදිසාවේ ආනවිලුන්දන්පත්තු ගම්සභාවේ අංක 4 දරණ කොට්ඨාශයේ සභික, ඇන්ටනී ජස්ටින් මිරැල් මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට තම සභික ධුරය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ලලිත් හෙට්ටිආරච්චි,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
හලාවත-පුත්තලම් දෙදිසාව.

1973 අප්‍රේල් මස 11 දින,
හලාවත පළාත් පාලන කාර්යාලයේ දී ය.

4-662—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

### ගම්සභා ආඥාපනත

13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

(257 වන අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 13 (1) වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් රුහුනේ කන්කානමලාගේ හර්මන් මයිකල් ප්‍රනාන්දු වන මම, රත්නපුර දිස්ත්‍රික්කයේ එල්ලාවල ගම්සභාවේ අංක 2 දරණ සභික, කොට්ඨාශයේ සභික, කන්කානමලාය අබේවර්ධන මහතා සභාවට දැන්වීමක් නොමැතිව සභාවේ පිට පිටමවූ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සැහීමකට පත්ව රත්නපුර දිස්ත්‍රික්කයේ එල්ලාවල ගම්සභාවේ අංක. 2 දරණ සභික කොට්ඨාශයේ සභික කන්කානමලාය අබේවර්ධන මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දින සිට තම ධුරය හිස්කර තිබෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

ආර්. කේ. එච්. ඇම්. ප්‍රනාන්දු,
රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන
සහකාර කොමසාරිස්.

1973 අප්‍රේල් මස 9 වෙනි දින,
රත්නපුර පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දීය.

4-657—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධන) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතෙහි 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, කෑගල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් හෙලකුමාරගේ පැරකුම් විජේසිංහ වන මම, කෑගල්ල දිස්ත්‍රික්කයේ අටුළුගම ගම්සභාවේ අංක 7 දරණ කුරුපැත්ත කොට්ඨාශයේ සභික සිංහපුර දේවගේ එමනෝරිස් මහතා, සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් අටුළුගම ගම්සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සැහීමකට පත්ව කෑගල්ල දිස්ත්‍රික්කයේ අටළුගම ගම්සභාවේ අංක 7 දරණ කුරුපැත්ත කොට්ඨාශයේ සභික සිංහපුර දේවගේ එමනෝරිස් මහතා මේ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දිනයේ සිට සභිකත්වය අත්හරින ලද බැව් මම මෙයින් ප්‍රකාශ කරමි.

පැරකුම් විජේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කෑගල්ල දිස්ත්‍රික්කය.

1973 අප්‍රේල් මස 10 දින,
කෑගල්ල පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දීය.

4-656—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරණ ගම්සභා (සංශෝධන) පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතෙහි 13 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාර, කෑගල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස් හෙලකුමාරගේ පැරකුම් විජේසිංහ වන මම, කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ගම්සභාවේ අංක 11 දරණ ආසිදෙනිය කොට්ඨාශයේ සභික පාට්ටගමගේ ආරියදාස මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් ගලිගමුව ගම්සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සැහීමකට පත්ව කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ගම්සභාවේ අංක 11 දරණ ආසිදෙනිය කොට්ඨාශයේ සභික පාට්ටගමගේ ආරියදාස මහතා මේ දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දිනයේ සිට සභිකත්වය අත්හරින ලද බැව් මම මෙයින් ප්‍රකාශ කරමි.

පැරකුම් විජේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කෑගල්ල දිස්ත්‍රික්කය.

1973 අප්‍රේල් මස 10 දින,
කෑගල්ලේ පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ දීය.

4-655—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

# තනතුරු – ඇබෑර්තු

## ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි

1. **දීමනා.**—රජයේ නිලධාරීන්ට අදාළ වන ප්‍රමාණයෙන් හා කොන්දේසි අනුව ජීවනාධාර දීමනාවක් ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවය භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(අ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරුවලට පත්කරනු ලබන සියලු දෙනාම, පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ඇත. මෙම අරමුදලට සේවකයා විසින් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් සියයට 6ක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. අදාළ නිළධාරීතැනාගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 9ක් ඔහු සේවය කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔහු වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිළධාරීන්, ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වන වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකරනු ලැබුවහොත්, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ. පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිළධාරියෙකු එම සේවයේ විශ්‍රාම වැටුප් සහිත වෙනත් තනතුරකට පත්කරන ලද්දේ නම් හෝ උසස් කරන ලද්දේ නම් ඔහු සිය නව තනතුරෙහි ද විශ්‍රාම වැටුප් හිමිකම තවදුරටත් භුක්ති විඳිනු ඇත.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට කලින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන සේවයේ මාසික වැටුප් ගෙවනු ලබන තනතුරු වලට පත්කරනු ලබන නිළධාරීන්ට වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය අදාළ නොවනු ඇත. එහෙත්, ස්ත්‍රීන්ද, වයස අවුරුදු 55ට වැඩි නිළධාරීන්ද, පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට පෙර, ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිළධාරීන්ද හැර, පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක සිට වෙනත් විශ්‍රාම වැටුප් සහිත තනතුරකට උසස් කරන හෝ පත්කරන ලද සියලු දෙනාටම 1952 ජූනි 30 වන දින හා 10,329 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියමි වයස :—.
අවුරුදු :———, මාස :———, දින :———.

(ආ) උපන් දිනය :—.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :———.

(ආ) අයදුම්කරුගේ පියා :———.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :———.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :———.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරවිය යුතුය.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :———.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ට සාමාර්ථය |
|---|---|---|---|---|
| පළමුවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)

| සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ට සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත්වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඇ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :———.

(ii) දෙමළ :———.

(iii) ඉංග්‍රීසි :———.

9. ලබාගෙන ඇති වෘත්තිය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම් :———.

10. වෘත්තිය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න :———.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :———.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :———.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :———.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :———.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :———.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :———.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :———

(ආ) දෙමළ :———.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන්කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේනම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :———.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද, එසේනම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :———.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කොතෙක්ද ? :———.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :———.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :———.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———,

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ.පෙ. 530, කොළඹ 1.

### කැකනදුර ගම් සභාව

පුස්තකාල භාරකාර තනතුර

ඉහත නම් සඳහන් ගම් සභාවේ පුස්තකාල භාරකාර තනතුර සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. වාර්ෂික වැටුප් ක්‍රමය.—රු. 504—30—744 යන වැටුප් ක්‍රමයට අනුව වැටුප් ගෙවනු ලැබේ.

3. තනතුර ස්ථිරය. අර්ථසාධක අරමුදලට හිමිකම් ඇත. මෙම පත් වීම අවුරුදු දෙකක ආධුනික කාලයකින් පසු ස්ථිර වේ.

4. අවශ්‍ය සුදුසුකම් :—

(i) ඉල්ලුම්කරු ලාංකිකයෙකු විය යුතු අතරම, මාතර ජන්දදායක කොට්ඨාශය තුළ 1973.4.1 වැනි දිනට අවුරුදු පහකට නො අඩු කාලයක් ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතුයි.

(ii) 1973.4.1 වෙනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා 30 ට නොවැඩි විය යුතුයි.

(iii) අපේක්ෂක/අපේක්ෂිකාවන් වාර දෙකකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් අංක ගණිතය ඇතුළු සම්මාන දෙකක් සහිතව සමත් වී සිටිය යුතුයි.

(iv) කාර්යාල ලිපි කටයුතු, පුස්තකාල කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා සිටීමත් විශේෂ සුදුසුකමක් හැටියට සලකනු ලැබේ.

5. අයදුම් කරුවන් තම අයදුම් පත්වලට පහත සඳහන් ලිපිවල පිටපත් අමුණා එවිය යුතුයි. (මුල් පිටපත් නොවේ.)

(i) උප්පැන්න සහතිකය,

(ii) ලබා ඇති අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික,

(iii) චරිතය පිළිබඳ ලබාගත් සහතික පිටපත් තුනක්,

මෙයින් එකක් ග්‍රාම සේවක සහතිකය විය යුතු අතර, එම සහතිකය ප්‍රා. ආ. නි. තුමා විසින් අනු අත්සන් කළ යුතුයි.

6. අයදුම් පත් :—

රජයේ ගැසට් පත්‍රයේ IV වෙනි කොටසේ ආරම්භයේ පළ කර තිබෙන පළාත් පාලන තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ අයදුම් පතට අනුකූලව සකස් කොට අයදුම් පත් 1973 මැයි මස 15 වෙනි දිනට හෝ ඊට ප්‍රථම කැකනදුර ගම් සභාවේ සභාපති තුමාට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

පියසේන දහනායක,
කැකනදුර ගම් සභාවේ සභාපති.

1973 අප්‍රේල් මස 10 දින,
කැකනදුර,
ගම් සභා කාර්යාලයේ දී ය.

4-708—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### පළාත් පාලන සේවය

පළාත් පාලන සේවයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් විභාගය—1973.07.07

පළාත් පාලන සේවයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයක් කොළඹ දී පවත්වනු ලැබේ.

2. අයදුම්පත්.—(i) විභාගයට ඇතුළත්වීමේ අයදුම්පත් මෙහි පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයෙහි පිළියෙළ කොට, "ලේකම්, පළාත් පාලන සේවා කොමිෂන් සභාව, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට එවිය යුතුයි.

(ii) අයදුම්පත් 1973.06.07 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එම දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) අයදුම්කරුවන් සිය අයදුම්පත්, තමා දැනට සේවයේ නියුක්ත ප්‍රාදේශීය බල මණ්ඩලයේ ප්‍රධානතුමා මාර්ගයෙන් එවිය යුතුයි. මෙසේ කිරීමට යම් අපේක්ෂකයෙකු අපොහොසත් වුවහොත්, ඔහු නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ.

(iv) 1973.06.07 වැනි දින හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ සිය අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තමා සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානතුමා වෙත සිය අයදුම්පත් කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

(v) මෙම විභාගයට පළමුවන වරට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් විභාග ගාස්තුවක් අය නොකෙරේ. අනිකුත් සෑම අයදුම්කරුවෙක්ම මුලු විභාගයටම පෙනී සිටින්නේ නම් තම අයදුම්පත්‍රවල රු. 15 ක් වටිනාකම ඇති මුද්දර අලවා යථා පරිදි අවලංගුකොට තිබිය යුතුයි. එක් විෂයකට පමණක් පෙනී සිටින්නේ නම් ඇලවිය යුතු මුද්දරවල වටිනාකම රු. 7.50 කි.

සැ. යු.—නියමිත ආකෘති පත්‍රයේ පිළියෙළ නොකරන ලද හෝ මෙම විභාගයේ නීතිරීතිවලට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අයදුම් පත් භාරගනු නො ලැබේ.

3. විභාගයට ඇතුළත් කර ගැනීම.—පිළිගනු ලැබූ අයදුම්පත්‍ර හිමි අයදුම්කරුවන්ට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් ප්‍රවේශ පත්‍ර නිකුත් කරයි. විභාගයට පෙනී සිටින අයදුම්කරුවෝ ස්වකීය ප්‍රවේශ පත්‍ර, විභාගය පරිපාලනය සඳහා පත් කරනු ලැබ සිටින නිලධාරියාට ඉදිරිපත් කළ යුතුයි. එසේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරන අපේක්ෂකයන් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

අයදුම්කරුවන් තමන්ට නියමිත විභාග ශාලාවෙහි විභාගයට පෙනී සිටිය යුතුයි. තමාට නියමිත විභාග ශාලාවේ හැර වෙනත් එකක විභාගයට පෙනී සිටීම සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

ප්‍රවේශ පත්‍රයක් සමග කාල සටහන් පිටපතක් ද අපේක්ෂකයින් වෙත එවනු ලැබේ. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාගය පැවැත්වෙන දිනයේදී ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලාව භාර නිලධාරියාට භාර දිය යුතුයි.

විභාගය පැවැත්වෙන දිනයට යටත් පිරිසෙයින් දින 7 කට වත් පළමු ස්වකීය ප්‍රවේශ පත්‍රය නොලැබුණහොත්, ඒ බව වහාම, "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට දැනුම් දිය යුතුයි. ඇතුළත්වීමේ ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව දැනුම් දෙන අතරම, පහත සඳහන් තොරතුරු ද සැපයිය යුතුයි :—

(ඒ) විභාගයේ නම :————.

(බී) අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

(සී) සම්පූර්ණ ලිපිනය :————.

සැ. යු.—විභාගයට ඇතුළත් කර ගැනීම, ඊට සුදුසුකම් පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

4. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත්, විභාගයෙන් පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඇතුළත්වීම අවලංගු කරන්නට පිළිවන.

5. විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.—පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පිළිගනු ලැබූ අයදුම්පත් හිමි ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවයේ නියුක්ත නිලධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා රාජකාරි නිවාඩු දෙන ලෙස, ප්‍රාදේශීය බලමණ්ඩලවල ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

6. හඳුනා ගැනීමේ පත්.—තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාග ශාලා භාර නිලධාරියාට අයදුම්කරු තමා බව ඒත්තු ගැන්විය යුතුයි. මේ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :—

(ඒ) තැපැල්පතිතුමා විසින් නිකුත් කරනු ලබන හඳුනා ගැනීමේ පතක් ;

(බී) මේ විභාගයේ දිනයට කලින් අවුරුදු 3 ක කාලසීමාව ඇතුළත දී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක් ;

(සී) මේ විභාගයේ දිනයට කලින් අවුරුදු 3 ක කාලසීමාව ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක් මගින් නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් සහිත සහතිකයක් හෝ බල පත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක් ;

(ඩී) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයෙකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපය පසු පිටෙහි දෙන ලද පහත සඳහන් සහතිකයක් දරන ඡායාරූපයක් :—

පසු පිටෙහි සඳහන් ඡායාරූපය මෙහි අත්සන් කර ඇති ........................යන අයගේ බව මම සහතික කරමි.
(අයදුම්කරුගේ නම)

————,
අයදුම්කරුගේ අත්සන.

————,
අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන.

නම හා තරාතිරම :————,

ලිපිනය :————;

විභාග ශාලාවේදී තමාගේ හැඳින්වීමේ පත් ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

7. **විභාග පරිපාටිය.**—විභාගය කොටස් තුනකින් යුක්ත වේ. එනම් :—

(ඒ) ලිඛිත පරීක්ෂණය (පැය 2½ යි) ... ලකුණු 100 යි.

(බී) ප්‍රායෝගික පරීක්ෂණය ... ලකුණු 50 යි.

(සී) වාචික පරීක්ෂණය ... ලකුණු 50 යි.

(ඒ) ලිඛිත පරීක්ෂණය—නිර්දේශ පත්‍රය.

(i) **ජල සෞඛ්‍ය පිළිබඳ දර්ශනය.**—සෞඛ්‍ය පිළිබඳ නවීන සංකල්පනය හා ඒ පිළිබඳ ජීව විද්‍යාත්මක චිත්ත වේගීය හා සමාජයීය පදනම සෞඛ්‍ය ගැටලු හා ජන සෞඛ්‍ය පරිපාලනයේ සංවර්ධනය ;

(ii) **ව්‍යවස්ථා හා නියෝග.**—ලංකාවේ නාගරික ප්‍රදේශවල සනීපාරක්ෂා පරීක්ෂකයින්ගේ රාජකාරිවලට අදාළ වන ආඥාපනත්, නියෝග හා ආදර්ශ අතුරු ව්‍යවස්ථාවන්ගේ විධිවිධාන, පරිපාලනය හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රතිපත්ති හා භාවිතය ;

(iii) **සෞඛ්‍ය අධ්‍යාපනය.**—ජන සෞඛ්‍යයෙහි සෞඛ්‍ය අධ්‍යාපනයට හිමි ස්ථානය, සෞඛ්‍ය අධ්‍යාපන මූල ධර්ම, ක්‍රම හා මාධ්‍යයෝ, ප්‍රජා සංවිධානය ;

(iv) **පරීක්ෂණය හා පරිපාලනය.**—විශේෂයෙන් කර්මාන්තයන් හා නිෂ්පාදනයන් හා සම්බන්ධ ගොඩනැගිලි, නිවාස, පොදු සහ වෙනත් නවාතැන්, කිරි පට්ටි, කිරිහල්, ගවමඩු, බේකරි, වෙළඳ පොළවල්, ගව ඝාතක ස්ථාන, කම්හල්, ඉස්තාල හා අප්‍රිය කර්මාන්ත හා පීඩාවන් පරීක්ෂා කිරීමේ ක්‍රම, පීඩාවන් අනාවරණය හා නිවාරණය ;

(v) **ජලය.**—බොන ජලයේ ස්වාභාවික ලක්ෂණ, මූලාශ්‍ර හා සම්පාදන ක්‍රම, එකතු කිරීම, රැස්කොට තැබීම හා බෙදා හැරීමේදී ජලය අපවිත්‍ර විය හැකි විවිධ මාර්ග, එසේ අපවිත්‍ර වීම වැළැක්වීමේ විධි, ගංගා, වැව්, ළිං හා පොකුණු අපවිත්‍ර වීම, අපවිත්‍රවීමේ මාර්ග හා අන්තරාය ;

(vi) **ආහාර.**—ආහාර හා ආහාර පරීක්ෂාව සම්බන්ධයෙන් පරීක්ෂකයාගේ රාජකාරි, මාලු, එළවලු සහ පලතුරු ඇතුළුව හොඳ හා නරක ආහාරවල ලක්ෂණ, කිරි සහ කිරිවලින් නිෂ්පාදිත ද්‍රව්‍ය, බෝවෙන හා වෙනත් රෝග සහ ආහාර අතර සම්බන්ධය, ආහාර හා ඖෂධ ආඥාපනත ආදිය යටතේ ආහාර ආදර්ශයන් සකස් කිරීම, මනුෂ්‍ය පරිභෝජනය සඳහා ගන්නා සතුන්ගේ මළ සිරුරු, සන්ධි හා ඉන්ද්‍රියයන් හඳුනා ගැනීම හා පරීක්ෂා කිරීම, මෙහි මරන ලද පිට රටින් ගෙන්වන ලද හා නරක් නොවී තබා ගතහැකි සේ සකස් කරන ලද මස්වල ලක්ෂණ, ආහාරය සඳහා අදහස් කරන ලද සතුන්ගේ රෝග, රෝගී මස් සම්බන්ධයෙන් යෝග්‍ය ක්‍රියා මාර්ගය ;

(vii) **වාතය, වාතාශ්‍රය හා ආලෝක කිරීම.**—වාතයේ සංයෝගය හා වාතය අපවිත්‍රවීමේ විවිධ හේතු, වාතාශ්‍රය කිරීමේ මූලධර්ම හා කාමර හා ගොඩනැගිලි ආලෝක කිරීමේ හා වාතාශ්‍රය කිරීමේ සරල ක්‍රම ;

(viii) **ගොඩනැගිලි ඉදිකිරීම හා සනීපාරක්ෂාව.**—බිම් පෙදෙස්, අත්තිවාරම්, වහල හා තෙතමනය වළක්වන නිර්මාණ, විවිධ සනීපාරක්ෂක උපකරණයන්ගේ වාසි හා අවාසි, ඇඳීම් හා විශේෂ විස්තර අර්ථ කථනය, අළුත්වැඩියා පිළිබඳ උපලේඛන සකස් කිරීම ;

(ix) **ජලාපවහනය, කසළ කාණු ක්‍රමය හා කාණුවල කසළ බැහැර ලීම.**—විවිධ ජලාපවහන ක්‍රම පිළිබඳ දැනුමක් හා විශේෂ තත්ත්වයන් සඳහා ඒවා යොදා ගැනීම, කාණු තැනීම, කාණු වල කසළ ගැන ක්‍රියා කිරීම හා බැහැරලීම ;

(x) **කුණු කසළ එකතු කිරීම හා බැහැරලීම.**—කසළ ශෝධනය හා කර්මාන්ත, ගෙවල් හා වෙනත් මාර්ග වලින් එන කසළ පිළිබඳව ක්‍රියා කිරීමේ විවිධ ක්‍රම ;

(xi) **බෝවෙන රෝග වැළැක්වීම.**—බෝවීමේ ස්වභාවය, පැතිරීයාමේ මාර්ග හා ක්‍රමය, බෝවෙන රෝගවල විෂබීජ මෝරන කාල පරිච්ඡේදය, රෝග බෝවීම හා බෝවෙන රෝග වැළැක්වීමේ පියවර, බෝවෙන රෝග සම්බන්ධයෙන් විෂබීජ නාශකය හා ප්‍රතිශක්ති කරණය ;

(xii) **මැස්සෝ වන්දාකයෝ හා කෘමීහු.**—ඔවුන්ගේ ජීවන ඉතිහාසය, නිවාරණ කටයුතු, විනාශ කිරීම, ස්ථානයන්හි විෂබීජ නැසීම,

(xiii) **පෝෂණයේ මූල ධර්ම.**—සමබර ආහාරයක සංයෝගය, දුෂ්පෝෂණයේ බාහිර ලක්ෂණ හා නිමිති, ආහාර ක්‍රමයේ අඩු පාඩු නිවැරදි කිරීම, සාමාන්‍ය ආහාර ද්‍රව්‍යවල පෝෂණ අංශය, ආහාරයේ විවිධත්වය සඳහා ඇති අවශ්‍යතාව ;

(xiv) **සංඛ්‍යා ලේඛන.**—භාවිතා කරන වචනවල තේරුම, උපත් ප්‍රමාණය, මරණ ප්‍රමාණය, ළදරු මරණ ප්‍රමාණය ආදී සාමාන්‍ය ප්‍රමාණයන් ගණන් බැලීමේ අදහස හා ක්‍රමයත් ;

(xv) **කාර්යාලයීය ක්‍රමය.**—කාර්යාලයේ සාමාන්‍ය රාජකාරි, පොත් පත් හා ලේඛන තබා ගැනීමේ ක්‍රම, පිළිබඳ දැනුම, වාර්තා පිළියෙල කිරීම.

(බී) **ප්‍රායෝගික පරීක්ෂණය.**—නියමිත ස්ථානයට හෝ ආයතනයකට යාම, පරීක්ෂකයකු ඉදිරියේ නියම කරන ලද කාර්යක යෙදීම හෝ ඒ ගැන වාර්තාවක් ලිවීම ප්‍රායෝගික පරීක්ෂණයට ඇතුළත් වේ. අතර ගමන් සඳහා ගතවන කාලය හැර මේ සඳහා පැයක කාලයක් යොදනු ලැබේ.

(සී) **වාචික පරීක්ෂණය.**—අයදුම්කරුගේ දැනුම, ප්‍රවීණතාව, විෂය පිළිබඳ ඔහුගේ ප්‍රවේශ හා සංකල්පය නිශ්චය කළ හැකි වන අයුරින් එක් එක් අයදුම්කරුගෙන් අසනු ලබන ප්‍රශ්න 5 ක් හෝ 6 කින් මෙය සමන්විත වේ.

8. සාමාර්ථය ලද අයදුම්කරුවන්ගේ නම් ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළ කරනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1973 අප්‍රේල් මස 11 දින,
තැ. පෙ. 530-කොළඹ.

**පළාත් පාලන සේවයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා පවත්වනු ලබන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය—1973.7.7**

**අයදුම්පත**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. සම්පූර්ණ ලිපිනය :————.
(ලිපිනය වෙනස් වූ වහාම දැන්විය යුතුයි.)
3. ප්‍රාදේශීය බලමණ්ඩලයකට පළමුවෙන් පත්වීම ලද දිනය : ————.
4. ප.පා.සේ. සෞඛ්‍ය පරීක්ෂකවරයකු වශයෙන් පත්වීම ලද දිනය :————.
5. දැනට සේවය කරන ස්ථානය :————.
6. මෙම විභාගයට පෙනී සිටින්නේ පළමුවන වරටද යන්න සඳහන් කරන්න :————.

| |
|---|
| අයදුම්කරු අවශ්‍ය මුද්දර මෙහි අලවා ඒවා මත අත්සන් කළ යුතුය. |

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම් වෙත.

ඉහත නම සඳහන් අයදුම්කරු මෙම ප්‍රාදේශීය බලමණ්ඩලයේ සේවයේ යෙදී සිටින බවත්, ඔහු විසින් අයදුම්පතේ දී ඇති විස්තර නිවැරදි බවත් සහතික කරමි.

————,
නාගරික කොමසාරිස් / සභාපති,
..................නා. ස./ප. ආ. ස./සු. න. ස.

දිනය :————.

4-646—73.4.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

ඇල්.ඩී.–බී 34/45

**රත්නපුර මහ නගරසභාව**

**මහ නගරසභා ආඥාපනත**

(252 වැනි අධිකාරය වන) මහ නගරසභා ආඥාපනතේ 267 වැනි සහ 272 (4) වැනි වගන්තිය යටතේ රත්නපුර මහ නගරසභාව විසින් සම්පාදිතව එම ආඥාපනත 268 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලදුව නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් ස්ථිර කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ගා. බෙ. වික්‍රමනායක,
රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා
ස්වදේශ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 අප්‍රේල් මස 9 වැනි දින,
කොළඹදී ය.

## පොලොන්නරුව සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වන සහ 156 වන වගන්ති යටතේ පොලොන්නරුව සුළු නගර සභාව විසින් සම්පාදිතව, එකී ආඥාපනතේ 153 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ගාමිණී වික්‍රමනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

1. නව ගොඩනැගිලි සඳහා හෝ පවත්නා ගොඩනැගිලි වෙනස් කිරීම සඳහා හෝ (268 වැනි අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධාන යටතේ ඉදිරිපත් කරනු ලබන සැලසුම් (ප්ලෑන්) පරීක්ෂා කිරීම හා සලකා බැලීම සම්බන්ධයෙන්, මෙහිවූ උපලේඛනයෙහි නිශ්චිත ප්‍රමාණ අනුව තීරණය කරන ලද ගාස්තුවක් ගෙවිය යුතුය.

2. (i) 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවිය යුතු ගාස්තුව, පොලොන්නරුව සුළු නගර සභාවේ සභාපතිගෙන් ගෙවීම් ඉල්ලුම් ලැබී දින හතක් ඇතුළත, අනුමැතිය හෝ අභිමතය සඳහා ඉල්ලුම්කාර තැනැත්තා විසින් ගෙවිය යුතුය.

(ii) මෙම අතුරු ව්‍යවස්ථාවේ පෙරාතුව වූ ඡේදයෙහි නියමකොට ඇති කාලය තුළ එබඳු ගාස්තුව ගෙවීමට අපොහොසත් වන සෑම තැනැත්තෙක්ම වරදකට වරදකරු විය යුතු අතර, එසේ වරදකරු වීමෙන් රුපියල් සියයකට වැඩි නොවන දඩයකට යටත් විය යුතුය.

3. අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තුව ගෙවනතුරු කිසිම සැලසුමක් පරීක්ෂා කිරීම හෝ සලකා බැලීම නොකළ යුතුය.

### උපලේඛනය

1. නව ගොඩනැගිලි සඳහා හෝ පවත්නා ගොඩනැගිලිවලට අතිරේක බිම් ඉඩක් අවශ්‍යවන වෙනස් කිරීම් සඳහා වූ සැලසුම්

| | | රු. | ශ. |
|---|---|---|---|
| | (අ) සමුච්චිත බිම් ඉඩ වර්ග අඩි 500 ට වැඩි නොවන කල්හි ... ... | 5 | 0 |
| | (ආ) සමුච්චිත බිම් ඉඩ වර්ග අඩි 500 ට වැඩි නමුත් වර්ග අඩි 1,000 කට නොවැඩි කල්හි ... ... | 15 | 0 |
| | (ඇ) සමුච්චිත බිම් ඉඩ වර්ග අඩි 1,000 කට වැඩි නමුත් වර්ග අඩි 3,000 ට නොවැඩි කල්හි ... ... | 25 | 0 |
| | (ඈ) වර්ග අඩි 1,000 ක් වන සෑම අතිරේක ඒකකයක් හෝ ඉන් කොටසක් සඳහා | 25 | 0 |
| 2. | (අ) පවත්නා ගොඩනැගිලිවලට වෙනස් කිරීම් සඳහා අතිරේක බිම් ඉඩ අවශ්‍ය සැලසුම් සඳහා පවත්නා බිම් ඉඩ වර්ග අඩි 500 වැඩි වන කල්හි ... ... | 10 | 0 |
| | (ආ) වර්ග අඩි 500 ක් වන සෑම අතිරේක ඒකකයක් හෝ ඉන් කොටසක් සඳහා ... ... | 10 | 0 |
| 3. | අළුතෙන් සැලසුම් ඉදිරිපත් නොකට අනුමැතිය අළුත්කර ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් සම්බන්ධයෙන් ... ... | 5 | 0 |

මෙම උපලේඛනයෙහි "බිම් ඉඩ" යන්නෙහි බිම් මහලෙහි ඉඩ හෝ වෙනත් යම් මහලක ඉඩ අදහස් වේ.

4–645—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

## බෙලිඅත්ත නගරය

### සුළු නගර සභා ආඥාපනත

(256 වන අධිකාරය) සුළු නගර සභා ආඥාපනතේ 152 හා 156 වන ව්‍යවස්ථාවන් යටතේ බෙලිඅත්ත නගරයේ විශේෂ කොමසාරිස් වරයා විසින් සම්පාදිත එකී ආඥාපනතින් 153 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු
අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973. 3. 31 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

බෙලිඅත්ත සුළු නගර සභාව විසින් සම්මත කර ගන්නා ලද ජල සම්පාදනය සම්බන්ධයෙන් වූ අතුරු ව්‍යවස්ථාවල XXV වන කොටස යටතේ 41(1) වන ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

41 (1) ගෙදර දොර කටයුතු සඳහා මාපක යන්ත්‍රයක් සපයා නොමැතිව ජලය යොදවනු ලබන පෞද්ගලික ජල නල සම්බන්ධතාවයක් සඳහා සභාවට කාර්තුවකට පහත සඳහන් අයුරු ගාස්තු ගෙවිය යුතුය:—

(ස්ථානයෙන් කොටසක් හෝ සම්පූර්ණයෙන් පාවිච්චිය සඳහා)

| | |
|---|---|
| අඟල් 3/4 විෂ්කම්භය ඇති ජල සම්බන්ධකයක් වෙනුවෙන් කාර්තුවකට රුපියල් ... | 9 00 |
| අඟල් 1/2 විෂ්කම්භය ඇති ජල සම්බන්ධකයක් වෙනුවෙන් කාර්තුවකට රුපියල් ... | 6 00 |

4–590—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

ඇල්.ජී—බී. 39/50

## මාතිපායි සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වැනි සහ 156 වැනි වගන්ති යටතේ මාතිපායි සුළු නගර සභාව විසින් සාදනු ලැබ, එම ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ගා. බෙ. වික්‍රමණායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973. 4. 10 වැනි දින,
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථා

මේ අතුරු ව්‍යවස්ථා, 1973 මාතිපායි සුළු නගර සභාවේ ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්විය හැකිය.

2. කිසියම් වීදියක, පාරක, ඇලක හෝ වැවක සිට පෙනෙන පරිදි යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම හෝ ප්‍රදර්ශනය කරවීම, ඒ සම්බන්ධයෙන් සභාපති විසින් නිකුත් කළ අවසර පත්‍රයක බලය යටතේ මිස, කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

එසේ වුවද, මේ අතුරු ව්‍යවස්ථාවේ ඉහත කී විධිවිධාන පහත සඳහන් දැන්වීම්වලින් යම් කිසිවක් සම්බන්ධයෙන්, ඒ ප්‍රචාරක දැන්වීම ආලෝකවත් කොට ඇතොත් හෝ ඉහලින් සවි කරන සංඥා දැන්වීමක් වෙතොත් මිස, අදාල නොවිය යුතුය:—

(අ) එකතු වන ශුද්ධ ලාභ පුණ්‍යාධාර කටයුතු සඳහා යෙදවීම පිණිස පවත්වන යම් විනෝද කටයුත්තකට අදාළ ප්‍රචාරක දැන්වීමක්;

(ආ) ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කොට තබා ඇති ස්ථානයේ පවත්වනු ලබන යම් විනෝද කටයුත්තකට අදාළ ප්‍රචාරක දැන්වීමක්;

(ඇ) රජය මගින් ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීමක්;

(ඈ) යම් ආගමික, දේශපාලන හෝ වෙනත් ප්‍රසිද්ධ රැස්වීමකට අදාළ ප්‍රචාරක දැන්වීමක්;

(ඉ) යම් ගොඩනැගිල්ලක ජනේලයක වූ ප්‍රචාරක දැන්වීමක්;

(ඊ) "කුලියට දීමට තිබේ" යන ප්‍රචාරක දැන්වීමක්;

(උ) "විකිණීමට තිබේ" යන ප්‍රචාරක දැන්වීමක්;

(ඌ) ගෘහ නාම තහඩුවක්;

(එ) ප්‍රමාණයෙන් වර්ග අඩි එකකට වැඩි නොවන, වෘත්තීය කාර්යයන් සඳහා පාවිච්චි කෙරෙන නාම තහඩුවක් ;

(ඒ) වෙළඳාම් කටයුතු සඳහා පාවිච්චි කරන වාහනයක, ඒ වාහනය අයිතිකරුගේ නාම සහ ලිපිනය ප්‍රදර්ශනය කෙරෙන ප්‍රචාරක දැන්වීමක් ; හෝ

(ඔ) ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කෙරෙන ස්ථානයේ පවත්වා ගෙන යනු ලබන වෙළඳාමකට හෝ ව්‍යාපාර කටයුත්තකට අදාළ ප්‍රචාරක දැන්වීමක්.

3. (1) යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයක් ලබා ගැනීම පිණිස කෙරෙන සෑම ඉල්ලීමක් ම ඒ දැන්වීම ප්‍රදර්ශනය කිරීමට අදහස් කරන දිනයේ සිට යටත් පිරිසෙයින් දින හතකටවත් ප්‍රථම සභාපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද කිසියම් විශේෂ අවස්ථාවකදී මේ ඡේදයේ ඉහත සඳහන් විධිවිධානවල නියමිත කාල සීමාව තුළ ඉදිරිපත් කරනු නොලබන ඉල්ලුම් පත්‍රයක් සභාපති විසින් භාරගත හැකිය.

(2) (1) වැනි ඡේදයේ සඳහන් සෑම ඉල්ලීමක් සමගම ඉල්ලුම්කරු විසින් ප්‍රචාරය කිරීමට බලාපොරොත්තු වන ප්‍රචාරක දැන්වීමේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

(3) (1) වැනි ඡේදයේ සඳහන් ඉල්ලීමක් සභාපති විසින් අනුමත කරන විටක දී ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම සඳහා වූ අවසර පත්‍රයට, මෙහි වූ උපලේඛනයේ සඳහන් ගණන් අනුව පිළියෙල කරන ලද ගාස්තුවක් ගෙවීමට සභාපති විසින් ඉල්ලුම්කරුට නියම කළ යුතුය. ඒ ගාස්තුව ගෙවන තෙක් ඒ අවසර පත්‍රය ඉල්ලුම්කරුට නිකුත් නොකළ යුතුය.

4. (1) ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර පත්‍රයක් යම් තැනැත්තකු වෙත නිකුත් කළ අවස්ථාවක—

(අ) ඒ ප්‍රචාරක දැන්වීමේ සෑම පිටපතකම, ඒ අවසර පත්‍රයේ අංකය හා දිනය සඳහන් කිරීමට, හෝ

(ආ) ඒ අවසර පත්‍රය සඳහා ගාස්තුවක් ගෙවූ බවට සළකුණක් වශයෙන් මුද්‍රා තැබීමේ කාර්යය සඳහා ඒ ප්‍රචාරක දැන්වීමේ සෑම පිටපතක් ම සභාපති වෙත ඉදිරිපත් කිරීමට,

සභාපති විසින් ඒ තැනැත්තාට නියම කළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදය යටතේ සභාපති විසින් යම් තැනැත්තකුට විධානයක් කළේ ද, ඒ තැනැත්තා විසින් ඒ විධානය ඉෂ්ඨ කළ යුතුය.

5. කිසිම තැනැත්තකු විසින්—

(1) සභාපති විසින් අනුමත කරන ලද ආකාරයට තනන ලද හා ගොඩනගන ලද නෙරායන සංඥාවක් වූ ප්‍රචාරක දැන්වීමක් වෙතොත් මිස, ගොඩනැගිලි සීමාවේ සිට තිරස් අතට කෙළින් මැනීමෙන් පසුව පාරක් හෝ වීථියක් උඩින් අඟල් 6 කට වඩා දුර නෙරායන සෙ යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීම ;

(2) යම් වීථියක හෝ පාරකට යාබද ගොඩනැගිල්ලකට මුහුණතව, ඒ මුහුණතේ සීමාවලින් පිටතට නෙරා සිටින සේ දිග් වූ නැතහොත් උසින් පදික වේදිකාවේ හෝ පොලොවේහි මධ්‍ය සමතාවයේ සිට සංඥාවේ යට මට්ටම දක්වා ඇති දුර ප්‍රමාණයෙන් හතරෙන් එකකට වඩා කිසිම තැනක වැඩිවූ ඉහළින් සවි කරන යම් දැන්වීම් සංඥාවක් සවි කිරීම හෝ එල්ලා තැබීම ;

(3) සභාපති විසින් අනුමත නොකළ ආකාරයට, ඉහළින් සවි කරන දැන්වීම් සංඥාවක් සෑදීම හෝ ඉදිකිරීම,

නොකළ යුතුය.

6. කිසිම තැනැත්තකු විසින්, යම් ප්‍රසිද්ධ වන්දනීය ස්ථානයක, ප්‍රසිද්ධ උද්‍යානයක හෝ වැසිකිළියක හෝ යම් පාලමක, වීථියක, ලාම්පු කණුවක හෝ විදුලි සංඥා හෝ විදුලි පණිවුඩ කණුවක කිසියම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදශර්නය කරවීම නොකළ යුතුය.

7. කිසිම තැනැත්තකු විසින්, යම් පාරක හෝ වීථියක ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා කිසියම් ශබ්ද විදුලි යන්ත්‍රයක්, ග්‍රාමෆෝනයක්, තූර්යවාදන භාණ්ඩයක්, සීනුවක් හෝ වෙනත් යම් භාණ්ඩයක් පාවිච්චි නොකළ යුතුය.

8. (1) යම් ප්‍රචාරක දැන්වීමක් සභාපතිගේ අදහස අනුව අශෝභන හෝ නොනිසි තත්ත්වයක තිබේ නම් ඔහු විසින් ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ නියමිත කාලය තුළ ඒ ප්‍රචාරක දැන්වීම ප්‍රදර්ශනය කිරීම නතර කරන ලෙස එය ප්‍රදර්ශනය කරවන තැනැත්තාට නියම කළ හැකිය.

(2) සභාපති විසින් (1) වැනි ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ තැනැත්තෙකු විසින් දැන්වීමේ කාලය ඇතුළතදී ඒ දැන්වීම අනුව ක්‍රියා කළ යුතුය.

9. ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීම සඳහා පාවිච්චි කරනු ලබන යම් දැන්වීම් පුවරුවක අයිතිකරු හෝ බදුකරු විසින්—

(අ) එම දැන්වීම් පුවරුව නිසි පරිදි අළුත්වැඩියා කර සුරක්ෂිත තත්ත්වයක පවත්වා ගෙන යා යුතුය ; තවද,

(ආ) තමාගේ නම සහ ලිපිනය පහසුවෙන් කියවිය හැකි පැහැදිලි අකුරෙන් ඒ දැන්වීම් පුවරුවේ ඉදිරිපසින් ප්‍රකට ස්ථානයක පෙන්නුම් කළ යුතුය.

10. යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ අවසර පත්‍රය සඳහා මුදල් ගෙවූ බවට සලකුණක් වශයෙන් සභාපති විසින් එම දැන්වීමේ තබන ලද යම් සංඥාවක්, සළකුණක්, අකුරක්, වචනයක් හෝ ඉලක්කමක් මැකීම හෝ මැකවීම කිසිම තැනැත්තකු විසින් නොකළ යුතුය.

11. කිසිම තැනැත්තකු විසින්—

(අ) සභාපති විසින් අනුමත කරන ලද ආකාරයකට හෝ ස්වරූපයකට වෙනස් අයුරින් යම් ප්‍රචාරක දැන්වීමක් වාහනයක ප්‍රදර්ශනය කරවීම, හෝ

(ආ) පොලිස් අධිකාරී විසින් අනුමත කළ ආලෝකමත් ප්‍රචාරක දැන්වීමක් හැර වෙනයම් ආලෝකමත් ප්‍රචාරක දැන්වීමක් ඇති යම් වාහනයක් යම් වීථියක හෝ පාරක පදවාගෙන යාමට සැලැස්වීම,

නොකළ යුතුය.

12. මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන වලින් යමක් කඩ කරමින් කටයුතු කරන යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර වරදකරු වීමේ දී රුපියල් පනහකට වැඩි නොවන දඩයකටද යටත් විය යුතු අතර, ඒ කඩකිරීම දිගටම සිදු කරන අවස්ථාවකදී එසේ වරදකරු කිරීමෙන් පසුව ඒ වරද සිදු කරන එක් එක් දිනයක් සම්බන්ධයෙන් රුපියල් පහලොවකට නොවැඩි තවත් දඩයකට යටත් විය යුතුය.

13. පද සම්බන්ධයෙන් අන්‍ය අර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මෙම අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රචාරක දැන්වීම" යන්නට ප්‍රචාරක දැන්වීමක ස්වභාවයේ වූ හෝ ප්‍රචාරක කාර්යයන් සඳහා සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් පාවිච්චි කරනු ලබන්නාවූද, යම් ඉඩමක, ගොඩනැගිල්ලක හෝ ඉදි කිරීමක දැක්වෙන්නාවූද, නැතහොත් එහි රඳවා ඇත්තාවූද යම් වචනයක්, අකුරක්, අංකයක්, සංඥාවක්, දැන්වීම් කොළයක්, බෝඩ් එකක්, දැන්වීමක්, උපක්‍රමයක්, ආදර්ශයක් හෝ නිරූපනයක් ඇතුළත් වේ ;

"සභාපති" යන්නෙන් සභාවේ සභාපති අදහස් වේ ;

"සභාව" යන්නෙන් මාතිපායි සුළු නගර සභාව අදහස් වේ ;

"දැන්වීම් පුවරුව" යන්නෙන් යම් ප්‍රචාරක දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේ කාර්යය සඳහා ඉදි කරනු ලබන හෝ පාවිච්චි කරනු ලබන යම් ඉදි කිරීමක්, උපස්ථම්භයක්, කණුවක්, රැල්ලක්, තාප්පයක්, පෙට්ටියක් හෝ වෙනත් උපක්‍රමයක් අදහස් වේ ;

"ඉහළින් සවිකරන දැන්වීම් සංඥාව" යන්නෙන් යම් වීථියක, මාර්ගයක, ඇලක, හෝ වැවක යම් තැනක සිට බැලුවිට සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් අහස පසුබිම් කොට පෙනෙන පරිදි යම් ඉඩමක, ගොඩනැගිල්ලක හෝ වෙනත් ඉදි කිරීමක හෝ එබන්දකට උඩින් දැක්වෙන යම් කණුවකට, රිටකට, ධජයකට, රාමුවකට හෝ වෙනත් උපස්ථම්භයකට සවි කරන ලද ප්‍රචාරය කිරීමේ කාර්යය සඳහා වූ යම් වචනයක්, අකුරක්, ආදර්ශයක්, සංඥාවක්, උපක්‍රමයක් හෝ නිරූපනයක් අදහස් වන අතර ප්‍රචාරය කිරීම සඳහා සම්පූර්ණ වශයෙන් හෝ කොටස් වශයෙන් හෝ යම් ඉඩමක, ගොඩනැගිල්ලක, ඉදිකිරීමක, වීථියක හෝ මාර්ගයක හෝ එබන්දකට උඩින් පාවිච්චි කරනු ලබන යම් බැලූනයක්, පැරෂුටයක්, ඒරෝප්ලේන් එකක් හෝ වෙනත් එබඳු උපක්‍රමයක් ද එයට ඇතුළත් වේ.

## උපලේඛනය

අවසර පත්‍ර සඳහා අය කරනු ලබන ගාස්තු ප්‍රමාණය

| | රු. ශත |
|---|---|
| (අ) එක් එක් වර්ෂය සඳහා හෝ ඉන් කොටසක් සඳහා එක් එක් වර්ග අඩියට ... ... | 10 0 |
| (ඇ) එක් එක් මාසය සඳහා හෝ ඉන් කොටසක් සඳහා ප්‍රචාරක ධජයකට ... ... | 25 0 |

4-721—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

## ගලේවෙල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වැනි සහ 156 වැනි වගන්ති යටතේ ගලේවෙල සුළු නගර සභාව විසින් පනවනු ලැබ, ඒ ආඥාපනතේ 153 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ගා. බ. වික්‍රමණායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 අප්‍රේල් මස 07 දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථා

1. (i) මේ අතුරු ව්‍යවස්ථා 1973 ගලේවෙල පොළ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හැඳින්විය හැකිය.

(ii) ගලේවෙල පොළ නමින් හඳුන්වනු ලැබීමට නියමිත හා එසේ හැඳින්වෙන පොළක් සෑම බදාදා හා සෙනසුරාදා දිනයන්හිදී හෝ සභාව විසින් නියම කරන වෙනත් යම් දිනකදී සභාව විසින් පැවැත්විය යුතුය.

2. (i) සභාපති විසින් හෝ සභාපතිගේ බලය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරන්නෙකු හෝ එලෙස අවසර පත්‍රයක් දරන්නෙකුගේ සේවකයෙකු හෝ නියෝජිතයෙකු හැර වෙනත් කිසිම තැනැත්තකු විසින් පොළ පිහිටි භූමිය ඇතුළත කිසියම් වෙළෙඳ කඩ කාමරයක් හෝ ස්ථානයක් පාවිච්චි නොකළ යුතුය.

(2) (i) වැනි ඡේදය යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක්ම මෙහි වූ 1 වැනි උප ලේඛණයෙහි දක්වා ඇති ආකෘතියට සාරානුකූලව විය යුතු අතර, නිකුත් කරන දිනයට පමණක් වලංගු විය යුතුය.

3. පොළ පිහිටි භූමිය ඇතුළත වූ කඩ කාමරයක් හෝ ස්ථානයක් පාවිච්චි කිරීම සඳහා 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරණ සෑම තැනැත්තෙකු විසින්ම මෙහි වූ දෙවැනි උප ලේඛණයෙහි නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රමාණ අනුව ගාස්තුවක් ගෙවිය යුතුය.

4. 3 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවිය යුතු ගාස්තු එකතු කර ගැනීමට සභාව නිලධාරියෙකු නොයොදවන්නේ නම් ගාස්තු එකතු කර ගැනීමේ අයිතිය ටෙන්ඩර් කැඳවීමෙන් අනුමත කරන ලද තැනැත්තෙකුට බදු දිය හැකිය.

5. (1) 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක් දරන කිසිම තැනැත්තෙකු විසින් පොළ පිහිටි භූමිය ඇතුළත යම් මස් වර්ගයක් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශණය කිරීම නොකළ යුතුය.

එසේ වුවද, එවැනි භාණ්ඩයක් හෝ ද්‍රව්‍යයක් විකිණීමට හෝ විකිණීම සඳහා ප්‍රදර්ශණය කිරීමට සභාපති විසින් ඒ සඳහා නිකුත් කරනු ලබන විශේෂ අවසර පත්‍රයක් මගින් ලබන බලය යටතේ එසේ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශණය කිරීම කළ හැකිය.

(2) එවැනි අවසර පත්‍රයක් නිකුත් කිරීමට සුදුසුවූද, ප්‍රමාණවත්වූද, හේතු ඇතැයි සභාපති සැහීමට පත් වුවහොත් මිස එබඳු විශේෂ අවසර පත්‍රයක් නිකුත් නොකළ යුතුය.

6. 2 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරන ලද අවසර පත්‍ර දරන්නන් අතර හෝ එකී අවසර පත්‍ර දරන්නන්ගේ බලය ලත් සේවකයින් අතර හෝ ඔවුන් සහ මහජනයා අතර වෙළඳ පොළ පාවිච්චි කිරීම සම්බන්ධයෙන් ඇතිවන කිසියම් ආරවුලක් සභාපති විසින් බලය පවරණු ලැබූ රාජකාරියෙහි යෙදී සිටින කිසියම් නිලධාරියෙකු විසින් පොළ පිහිටි භූමිය තුළදී නිරවුල් කළ හැකිය.

7. පොළ පිහිටි භූමිය තුළ සාමය පවත්වා ගැනීම එම කාර්ය සභාව විසින් පත් කරනු ලබන සහ පොළ පිහිටි භූමිය තුළ රාජකාරියෙහි යෙදී සිටින නිලධාරියෙකු විසින් කළ යුතුය.

8. බඩු මිලදී ගැනීම සඳහා හෝ විකිණීම සඳහා පොළට පැමිණෙන සෑම තැනැත්තෙකු විසින්ම සභාවේ නිලධාරියෙකු විසින් හෝ පොලිස් නිලධාරීයෙකු විසින් කිසියම් ආරාවුලක් නිරවුල් කිරීම සඳහා හෝ සාමය අරක්ෂා කිරීම සඳහා දෙනු ලබන යම් නීත්‍යානුකූල නියෝගයක් පිළිපැදිය යුතුය.

9. කිසියම් තැනැත්තෙකු පොළ පිහිටි භූමිය ඇතුළත—

(අ) යම් පිසීමක් කරගෙන යාම හෝ,

(ආ) අවිනීත අත්දමින් හැසිරීම හෝ කිසියම් ශබ්දයක් හෝ කරදරයක් කිරීම හෝ වෙනත් යම් තැනැත්තෙකු සමග දබර කර ගැනීම හෝ අපහාසාත්මක, නින්දා සහගත හෝ අවිනීත වචන පාවිච්චි කිරීම හෝ,

(ඇ) සභාවේ නිලධාරියෙකු විසින් හෝ ග්‍රාම සේවක හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ සභාපති බලය යටතේ කටයුතු කරන යම් තැනැත්තෙකු විසින් හෝ ඉවත්ව යන ලෙස නියම කරනු ලැබීමෙන් අනතුරුවත් තව දුරටත් රැඳී සිටීමට සැහෙන හේතු නොපෙන්වා රැඳී සිටීම හෝ සුනංගු වීම, හෝ

(ඉ) සූදු ක්‍රීඩාවේ යෙදීම හෝ,

නොකළ යුතුය.

10. (1) පොළ පිහිටි භූමිය ඇතුළත විකිණීම සඳහා ප්‍රදර්ශණය කොට ඇති යම් ආහාර ද්‍රව්‍යයක් ආහාර පිණිස යෝග්‍ය නොවන බව තමාට පෙනී ගියහොත් සභාපති විසින් හෝ වෛද්‍ය නිලධාරියා විසින් හෝ සභාපතිගේ බලය යටතේ ක්‍රියා කරන යම් සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු විසින් ඒ ආහාර ද්‍රව්‍ය පරීක්ෂා කොට තහනමට ගැනීම නීත්‍යානුකූල විය යුතුය.

(2) (1) වැනි ඡේදය යටතේ තහනම් කරන ලද ද්‍රව්‍යයක් ආහාර යට නුසුදුසු බව රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබුව හොත්, ඒ ද්‍රව්‍ය තහනම් කිරීමේදී එය අයිතිව තිබූ තැනැත්තාට වන්දියක් නොගෙවා ඒ ද්‍රව්‍ය විනාශ කළ හැකිය.

11. (1) සභාපති විසින් වෙළඳ පොළ පරිපාලනය කරනු වස් පත් කරන ලද යම් නිලධාරියෙකු හෝ තැනැත්තෙකු රාජකාරියේ යෙදී සිටියදී කිසිම තැනැත්තෙකු විසින් ඔහුට විරුද්ධකම් කිරීම, අවහිර කිරීම, බාධා කිරීම හෝ හිරිහැර කිරීම නොකළ යුතුය.

(2) කුලී ගාස්තු අයකර ගනු වස් සභාව විසින් හෝ (කුලී ගාස්තු එකතු කිරීමේ අයිතිය බදු දී ඇති අවස්ථාවක නම්) බදු හිමියා විසින් හෝ පත් කරනු ලබන කිසියම් තැනැත්තෙකු රාජකාරියේ යෙදී සිටියදී යම් තැනැත්තෙකු ඔහුට විරුද්ධකම් කිරීම, අවහිර කිරීම, බාධා කිරීම හෝ හිරිහැර කිරීම නොකළ යුතුය.

12. කිසියම් තැනැත්තෙකු විසින් —

(අ) පොළ පැවැත්වෙන දිනයට පූර්ව දිනයෙහි පස්වරු 3.00 ට පෙර පොළ පිහිටි භූමිය ඇතුළත යම් මඩු හෝ පියස්ස සහිත ආකෘති ඉදි කිරීම හෝ පැදුරු හෝ ගෝනි තැබීම, හෝ

(ආ) පොළ පැවැත්වෙන දිනයට පසු දින පෙරවරු 9.00 න් පසුව පොළ පිහිටි භූමිය තුළ යම් මඩු හෝ පියසි සහිත ආකෘති හෝ පැදුරු හෝ ගෝනි හෝ වෙන යම් ද්‍රව්‍යයක් තැබීම නොකළ යුතුය.

13. පොළ පැවැත්වෙන දිනයට පසු දිනයෙහි පෙ. ව. 9.00ට පසුව පොළ පිහිටි භූමිය ඇතුළත වූ ඉවත් නොකොට තබා ඇති යම් මඩු, පියස්ස සහිත ආකෘති පැදුරු, ගෝනි හෝ වෙන යම් ද්‍රව්‍යයක් සභාපති විසින් හෝ සභාපතිගේ බලය යටතේ ක්‍රියා කරන සභාවේ වෙන යම් නිලධාරියෙකු විසින් ඉවත් කිරීම නීත්‍යානුකූල විය යුතුය.

14. මෙම අතුරු ව්‍යවස්ථා අතුරෙන් කිසිවක් උල්ලංඝණය කරනු ලැබුවහොත් රුපියල් සියයකට නොවැඩි දඩයකින් දඬුවම් කළ හැකි විය යුතු අතර, නිසි අධිකරණ බලය ඇති උසාවියකින් වැරදිකරු බව ඔප්පු කරනු ලැබීමෙන් අනතුරුව හෝ සභාපති විසින් හෝ සභාපති විසින් බලය දෙනු ලැබූ යම් නිලධාරියෙකු විසින් එකී උල්ලංඝනය කිරීම ගැන අවධානය යොමු කරමින් ලිඛිත නිවේදනයක් භාර දෙනු ලැබීමෙන් අනතුරුව උල්ලංඝනය කිරීම අඛණ්ඩව කරගෙන යන සෑම දිනයක් වෙනුවෙන්ම රුපියල් විසිපහකට වැඩි නොවන අතිරේක දඩයකින් ද දඬුවම් කළ හැකි විය යුතුය.

### I වැනි උප ලේඛණය

දිනය :————,

ගලේවෙල සුළු නගර සභාව

ගලේවෙල බදාදා/සෙනසුරාදා පොළ

..........................................මහතා/මහත්මියගෙන්

| | රු. | ශ. |
|---|---|---|
| (1) වර්ග අඩි 50 ක් හෝ ඊට වැඩි කඩ කාමරයක් සඳහා (අංක ...... දරණ කාමරය) | ...... | ...... |
| (2) වර්ග අඩි 50ට අඩු කාමරයක් සඳහා (අංක ...... දරණ කාමරය) | ...... | ...... |
| (3) වර්ග අඩි 50ක් හෝ ඊට වැඩි බිම් කොටසක් සඳහා | ...... | ...... |
| (4) වර්ග අඩි 50ට අඩු බිම් කොටසක් සඳහා | ...... | ...... |
| (5) කෙසෙල් කැන් ...... ක් සඳහා | ...... | ...... |
| (6) කුරුම්බා ...... ක් සඳහා | ...... | ...... |
| (7) පොල් ...... ක් සඳහා | ...... | ...... |
| (8) පුවක් තොගයකට | ...... | ...... |
| (9) වෙනත් ද්‍රව්‍ය ........ සඳහා | ...... | ...... |
| එකතුව : | | |

රුපියල් ............ ශත ............ ක් භාර ගතිමි.

————,
මුදල් අය කරන නිලධාරියා.

### II වැනි උප ලේඛණය

| | දිනකට රු. | ශ. |
|---|---|---|
| (1) වර්ග අඩි 50කට හෝ ඊට වැඩි කඩ කාමරයක් සඳහා | 1 | 50 |
| (2) වර්ග අඩි 50කට අඩු කඩ කාමරයක් සඳහා | 1 | 0 |
| (3) වර්ග අඩි 50කට හෝ ඊට වැඩි බිම් කොටසක් සඳහා | 0 | 75 |
| (4) වර්ග අඩි 50කට අඩු බිම් කොටසක් සඳහා | 0 | 50 |
| (5) කෙසෙල් කැන් 1 ක් සඳහා | 0 | 05 |
| (6) කුරුම්බා එකක් සඳහා | 0 | 01 |
| (7) පොල් ගෙඩි එකක් සඳහා | 0 | 01 |
| (8) පුවක් තොගයකට | 0 | 75 |
| (9) වෙනත් ද්‍රව්‍ය සඳහා | 0 | 25 |

4-644—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

# ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

කෑගල්ල නගර සභාව

1971 වර්ෂයේ ආදයම් හා වියදම් ප්‍රකාශණය

| ආදයම් | රු. ශ. | වියදම් | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදයම් ... ... ... | 1,43,180 34 | ඒ.—සාමාන්‍ය වියදම් ... ... ... | 66,378 05 |
| බී.—මංමාවත් ... ... ... | 4,827 23 | බී.—මංමාවත් ... ... ... | 62,101 73 |
| සී.—තානායම් හා අම්බලම් ... ... | 9,249 65 | සී.—තානායම් හා අම්බලම් ... ... | 10,387 30 |
| ඩී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි ... ... | 5,852 83 | ඩී.—නගරසභා ඉඩම් හා ගොඩනැගිලි ... ... | 8,787 44 |
| ඊ.—මහජන සෞඛ්‍ය ... ... ... | 41,238 92 | ඊ.—මහජන සෞඛ්‍ය ... ... ... | 94,151 31 |
| එජ්.—මහජන විනෝදය ... ... | 7,608 25 | එජ්.—මහජන විනෝදය ... ... | 635 0 |
| ජී.—සුසාන භූමි ... ... ... | 770 50 | ජී.—සුසාන භූමි ... ... ... | 2,335 93 |
| එච්.—සුනඛයින් ලේඛණගත කිරීම ... ... | 13 0 | එච්.—සුනඛයින් ලේඛණගත කිරීම ... ... | 1 0 |
| ජේ.—විදුලිය දෙපාර්තමේන්තුව ... ... | 1,89,395 17 | ජේ.—විදුලිය දෙපාර්තමේන්තුව ... ... | 1,20,164 19 |
| කේ.—ගින්නෙන් ආරක්ෂා කිරීම ... ... | — | කේ.—ගින්නෙන් ආරක්ෂා කිරීම ... ... | 1 95 |
| එච්.—පුස්තකාලය හා කියවීම් ශාලාව ... ... | 750 0 | එච්.—පුස්තකාලය හා කියවීම් ශාලාව ... ... | 5,037 58 |
| සම්පූර්ණ ආදයම ... ... | 4,02,885 89 | සම්පූර්ණ වියදම ... ... | 3,69,981 48 |
| වෙනත් ලැබීම් —තැන්පත් මුදල් ... ... | 25,890 56 | වෙනත් ගෙවීම් :—තැන්පත් මුදල් ... ... | 38,139 42 |
| අත්තිකාරම් මුදල් ... ... | 24,341 80 | අත්තිකාරම් මුදල් ... ... ... | 38,885 80 |
| | | තානායම් සඳහා රජයේ ආධාර ... ... | 2,240 0 |
| සම්පූර්ණ ලැබීම් ... ... ... | 4,53,118 25 | නිවාස සඳහා රජයේ ආධාර ... ... | 2,104 30 |
| | | සම්පූර්ණ ගෙවීම් ... ... ... | 4,51,351 0 |
| 1970.12.31 දිනට ඉතිරිය ... ... | 42,663 43 | 71.12.31 දිනට ඉතිරිය ... ... | 44,430 68 |
| | 4,95,781 68 | | 4,95,781 68 |

කෑගල්ල නගර සභාවේ සභාපති සැම්පාල වෙදආරච්චි වන මම, ඉහත දක්වෙන ප්‍රකාශණය මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට, 1971 වර්ෂයේ කෑගල්ල නගර සභාවට ලැබුණු හා නගර සභාවෙන් ගෙවූ මුදල් පිළිබඳ සත්‍යවූත්, නිවැරදිවූත්, ප්‍රකාශණයක් බවට මෙයින් සහතික කරමි.

සැම්පාල වෙදආරච්චි,
සභාපති, කෑගල්ල නගර සභාව.

නිවැරදි බවට සහතික කරමි.

ඒ. එස්. එස්. හමීඩ්,
නගර සභික,

1972.3.15 දින කෑගල්ලේ දී මා ඉදිරිපිටදී සහතිකකරන ලදී.

හැරි අබේදීර,
සමාදාන විනිශ්චයකාර තැන,

1971.12.31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශණය

| වගකීම් | රු. ශ. |
|---|---|
| තැන්පත් මුදල් ... ... | 88,363 62 |
| රජයේ ආධාර ... ... | 6,741 53 |
| තානායම් ... ... | — |
| නිවාස යෝජනා ක්‍රමය ... ... | 5,617 86 |
| පුස්තකාලය ... ... | 0 57 |
| විදුලි බල ක්ෂය සංචිතය ... | 894 77 |
| | 1,01,618 35 |

| වත්කම් | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| අයවිය යුතු අත්තිකාරම් මුදල් ... ... | | | 29,150 55 |
| මුදල් ගිණුම—මහජන බැංකුවේ ඉතිරි මුදල ... ... | | 42,201 72 | |
| අතේ ඉතිරි මුදල ... ... ... | | 2,128 96 | |
| සුළු මුදල් ... ... ... | | 100 0 | |
| | | | 44,430 68 |
| අධිකතා හා ඌනතා ගිණුම : | | | |
| 70.12.31 දිනට ඌනතාවය ... ... | | 60,941 53 | |
| 71.12.31 දිනට අධිකය අඩුකොට | | | |
| 1971 ආදයම ... ... | 4,02,885 89 | | |
| 1971 වියදම ... ... | 3,69,981 48 | | |
| | | 32,904 41 | |
| 1971.12.31 දිනට ඌනතාවය ... ... | | | 28,037 12 |
| | | | 1,01,618 35 |

කෑගල්ල නගර සභාවේ සභාපති සැම්පාල වෙදආරච්චි වන මම, මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට ඉහත දක්වෙන ප්‍රකාශණය, 1971.12.31 දිනට කෑගල්ල නගර සභාවේ වගකීම් හා වත්කම් පිළිබඳ සත්‍යවූත්, නිවැරදිවූත්, ප්‍රකාශණයක් බවට මෙයින් සහතික කරමි.

සැම්පාල වෙදආරච්චි,
සභාපති, කෑගල්ල නගර සභාව.

නිවැරදි බවට,

ඒ. එස්. එස්. හමීඩ්.
නගර සභික,

1972.03.15 දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

හැරි අබේදීර,
සමාදාන විනිශ්චයකාර තැන.

### කෑගල්ල නගර සභාව

### 1970 වර්ෂයේ ආදායම් හා වියදම් ප්‍රකාශණය

| ආදායම් | රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම් | 1,33,204 39 |
| බී.—මංමාවත් | 1,784 26 |
| සී.—තානායම් හා අම්බලම් | 12,108 85 |
| ඩී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි | 4,134 98 |
| ඊ.—මහජන සෞඛ්‍යය | 40,097 66 |
| එප්.—මහජන විනෝදය | 7,954 25 |
| ජී.—සුසාන භූමි | 911 0 |
| එච්.—සුනඛයින් ලේඛණගත කිරීම | 8 0 |
| ජේ.—විදුලිය දෙපාර්තමේන්තුව | 2,00,138 54 |
| කේ.—ගින්නෙන් ආරක්ෂා කිරීම | — |
| එම්.—පුස්තකාලය හා කියවීම් ශාලාව | 750 0 |
| සම්පූර්ණ ආදායම | 4,01,091 93 |
| වෙනත් ලැබීම්—තැන්පත් මුදල් | 29,180 44 |
| අත්තිකාරම් මුදල් | 25,409 66 |
| තානායම් සඳහා රජයේ ආධාර | 8,250 0 |
| සම්පූර්ණ ලැබීම් | 4,63,932 03 |
| 1969.12.31 දිනට ඉතිරිය | 54,220 05 |
| | 5,18,152 08 |

| වියදම් | රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් | 68,386 56 |
| බී.—මංමාවත් | 57,504 69 |
| සී.—තානායම් හා අම්බලම් | 9,036 24 |
| ඩී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි | 9,315 42 |
| ඊ.—මහජන සෞඛ්‍යය | 1,07,386 83 |
| එප්.—මහජන විනෝදය | 1,108 85 |
| ජී.—සුසාන භූමි | 2,177 62 |
| එච්.—සුනඛයින් ලේඛනගත කිරීම | 1,091 42 |
| ජේ.—විදුලිය දෙපාර්තමේන්තුව | 1,51,793 82 |
| කේ.—ගින්නෙන් ආරක්ෂා කිරීම | 26 0 |
| එම්.—පුස්තකාලය හා කියවීම් ශාලාව | 4,795 98 |
| සම්පූර්ණ වියදම | 4,12,623 43 |
| වෙනත් ගෙවීම්— තැන්පත් මුදල් | 24,548 89 |
| අත්තිකාරම් මුදල් | 25,707 91 |
| තානායම් සඳහා රජයේ ආධාර | 6,208 42 |
| නිවාස සඳහා රජයේ ආධාර | 6,400 0 |
| සම්පූර්ණ ගෙවීම් | 4,75,488 65 |
| 1970.12.31 දිනට ඉතිරිය | 42,663 43 |
| | 5,18,152 08 |

කෑගල්ල නගර සභාවේ සභාපති සැම්පාල වෙදආරච්චි වන මම, ඉහත දැක්වෙන ප්‍රකාශණය මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1970 වර්ෂයේ කෑගල්ල නගර සභාවට ලැබුණ හා නගර සභාවෙන් ගෙවූ මුදල් පිළිබඳ සත්‍යවූත්, නිවැරදිවූත් ප්‍රකාශණයක් බවට මෙයින් සහතික කරමි.

සැම්පාල වෙදආරච්චි,
සභාපති, කෑගල්ල නගර සභාව.

නිවැරදි බවට සහතික කරමි.

හැරි අබේදීර,
නගර සභික.

1971.10.5 දින කෑගල්ලේදී මා ඉදිරිපිට සහතික කරන ලදී.

ජී. එස්. එස්. හමීඩ්,
සමාදාන විනිශ්චයකාර තැන

### 1970.12.31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශණය

| වගකීම් | රු. ශ. |
|---|---|
| තැන්පත් මුදල් | 1,00,612 48 |
| රජයේ ආධාර : | |
| තානායම | 8,981 53 |
| නිවාස යෝජනා ක්‍රමය | 7,722 16 |
| මහජන පුස්තකාලය | 0 57 |
| විදුලිබල ක්ෂය සංචිතය | 894 77 |
| | 1,18,211 51 |

| වත්කම් | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| අයවිය යුතුව ඇති අත්තිකාරම් මුදල | | | 14,606 55 |
| මුදල් ගිණුම : | | | |
| මහජන බැංකුවේ ඉතිරි මුදල | | 42,157 83 | |
| අතේ ඉතිරි මුදල | | 405 60 | |
| සුලු මුදල් | | 100 0 | |
| | | | 42,663 43 |
| අධිකතා හා ඌණතා ගිණුම— | | | |
| 69.12.31 දිනට ඌණතාවය | | 49,410 03 | |
| 72.12.31 දිනට ඌණතාවය එකතුකොට | | | |
| 1970 වියදම | 4,12,623 43 | | |
| 1970 ආදායම | 4,01,091 93 | | |
| | | 11,531 50 | |
| 70.12.31 දිනට ඌණතාවය | | | 60,941 53 |
| | | | 1,18,211 51 |

කෑගල්ල නගර සභාවේ සභාපති, සැම්පාල වෙදආරච්චි වන මම, මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට ඉහත දැක්වෙන ප්‍රකාශණය, 1970.12.31 දිනට කෑගල්ල නගර සභාවේ වගකීම් හා වත්කම් පිළිබඳ සත්‍යවූත්, නිවැරදිවූත්, ප්‍රකාශණයක් බවට මෙයින් සහතික කරමි.

සැම්පාල වෙදආරච්චි,
සභාපති, කෑගල්ල නගර සභාව.

නිවැරදි බවට, සහතික කරමි.

හැරි අබේදීර,
නගර සභික.

1971.10.20 වන දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ජී. එස්. එස්. හමීඩ්,
සමාදාන විනිශ්චයකාර තැන.

## 1971 වර්ෂයේ මොරටුව පළාත් ආණ්ඩු සභාවේ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනයයි

| ආදායම් | රු. ශ. | වියදම් | රු. ශ. |
|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම් ... | 14,32,846 8 | ඒ.—සාමාන්‍ය වියදම් ... | 3,66,510 98 |
| බී.—මහා මාර්ග ... | 31,139 38 | බී.—මහා මාර්ග ... | 4,92,504 59 |
| සී.—තානායම් ... | 13,735 23 | සී.—තානායම් ... | 9,606 32 |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 48,745 9 | ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි ... | 2,05,870 21 |
| ඊ.—මහජන සෞඛ්‍යය :— | | ඊ.—මහජන සෞඛ්‍යය— | |
| (2) කසළ ශෝධනය ... | 315 54 | (1) සාමාන්‍ය ... | 1,02,759 63 |
| (3) වැසිකිළි ශෝධනය ... | 2,030 76 | (2) කසළ ශෝධනය ... | 1,76,636 40 |
| (4) සතුන් මරන ස්ථානය හා ගව මඩුව ... | 10,637 0 | (3) වැසිකිළි ශෝධනය ... | 1,97,644 10 |
| (5) ජල සම්පාදනය ... | 2,58,363 2 | (4) සතුන් මරන ස්ථානය සහ ගව මඩුව ... | 3,253 70 |
| (6) ආරෝග්‍යශාලා ... | 76,335 84 | (5) ජල සම්පාදනය ... | 1,50,073 7 |
| (7) ගාල් සහ වෙළඳ පොලවල් ... | 32,196 41 | (6) ආරෝග්‍යශාලා ... | 1,31,425 37 |
| ඇප්.—මහජන විනෝදය ... | 60,901 44 | (7) වෙළඳ පොලවල් සහ ගාල් ... | 3,510 70 |
| ජී.—සුසාන භූමි ... | 4,226 87 | ඇප්.—මහජන විනෝදය ... | 18,380 37 |
| එච්,—බල්ලන් ලියාපදිංචි කිරීම ... | 655 50 | ජී.—සුසාන භූමි ... | 8,534 56 |
| අයි.—කිරුම් සහ මිනුම් ... | 1,694 45 | එච්.—බල්ලන් ලියාපදිංචි කිරීම ... | 1,828 90 |
| ජේ.—විදුලි දෙපාර්තමේන්තුව— | | අයි.—කිරුම් සහ මිණුම් ... | 579 86 |
| (1) ජීවනාධාර වි. ජීවනාධාර හා අමතර දීමනා . | 76,939 60 | ජේ.—විදුලි දෙපාර්තමේන්තුව— | |
| (2) වෙනත් ආදායම් ... | 13,05,161 50 | (1) ණය මුදල් ... | 22,392 45 |
| ඇම්.—කියවීම් ශාලා හා පුස්තකාල ... | 842 12 | (2) දීර්ඝ කිරීම් සහ සංවර්ධන වැඩ ... | 75,163 82 |
| ඇම්.—ඇම්. (5) විවිධ ආදායම් ... | 992 91 | (3) වෙනත් වියදම් ... | 13,11,298 06 |
| | | ඇම්.—කියවීම් ශාලා ... | 45,484 75 |
| වෙනත් ආදායම් හැර නියත ආදායම් ... | 33,57,758 74 | ඇම්.—ඇම්. (7) ආහාර නිෂ්පාදනය ... | 30 50 |
| වෙනත් ආදායම්— | | | |
| (1) තැන්පත් මුදල් | 5,67,552 73 | වෙනත් වියදම් හැර නියත වියදම ... | 33,23,488 34 |
| (2) අත්තිකාරම් ... | 1,84,883 94 | වෙනත් වියදම්— | |
| | | (1) තැන්පත් මුදල් ... | 3,27,774 16 |
| | | (2) අත්තිකාරම් ... | 2,79,442 90 |
| රජයේ ආධාර— | | රජයේ ආධාර— | |
| (1) මාතෘදරකාභිවෘද්ධි මධ්‍යස්ථාන ... | 5,000 0 | (1) මාතෘදරකාභිවෘද්ධි මධ්‍යස්ථාන ... | 2,500 0 |
| | | ස්ථාවර හැන්පත් මුදල් ... | 1,25,000 0 |
| | 41,15,195 41 | | |
| 1970.12.31 වන දිනට මුදල් පොතේ ශේෂය ... | 1,05,961 85 | | 40,58,205 40 |
| | | 1971.12.31 දිනට මුදල් පොතේ ශේෂය ... | 1,62,951 86 |
| | 42,21,157 26 | | 42,21,157 26 |

පළාත් ආණ්ඩු සභා පනතින් (255 වන අධිකාරය) මා වෙත පැවරී ඇති බලතල අනුව, 1971 වර්ෂයේ මොරටුව පළාත් ආණ්ඩු සභාව වෙනුවෙන් එකතු කළ ආදායම් සහ දරන ලද වියදම් දක්වෙන ඉහත සඳහන් ලේඛනය මොරටුව පළාත් ආණ්ඩු සභාවේ සභාපති ජයසුමන ධර්මබන්ධු වන මම, මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි.

ජයසුමන ධර්මබන්ධු,
සභාපති, මොරටුව පළාත් ආණ්ඩු සභාව.

නිවැරදි බවට සහතික කරමි.

මොරටුව පළාත් ආණ්ඩු සභා නියෝජිත.

මා ඉදිරිපිට දිවුරා අත්සන් කරන ලදී.

1973.2.6 වැනි දින,
මොරටුව පළාත් ආණ්ඩු සභා කාර්යාලයේ දීය.

පී. එස්. ඩග්ලස් ප්‍රනාන්දු,
සමාදාන විනිශ්චයකාර තැන.

## 71.12.31 වෙනි දිනට මොරටුව නගර සභාවේ වත්කම් හා බැරකම් ප්‍රකාශනයයි

| වගකීම් | රු. ශ. | වත්කම් | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|---|
| තැන්පත් ... | 9,91,305 25 | අත්තිකාරම් | | | |
| ආධාර — | | ස්ථිර තැන්පත් ... | | | 40,34,242 81 |
| පුස්තකාල ... | 227 95 | සේවිංස් බැංකුවේ තැන්පත් ... | | | 2,52,595 92 |
| කානු තැනීම ... | 2,74,935 12 | මුදල් ... | | | 3,345 14 |
| ප්‍රජාමණ්ඩල ... | 20 0 | ඌනතා ගිණුම ... | | | 1,62,954 81 |
| ධීවර නිවාස කොරළවැල්ල ... | 58 22 | 31.12.71 එකතු වූ ඌනතාවය ... | | 3,90,755 59 | |
| ළමා සුභසාධක ස්ථාන ... | 10,662 34 | 31.12.71 ආදායම | 33,57,761 69 | | |
| තානායම ... | 521 23 | 31.12.71 ගෙවීම් | 33,23,488 34 | | |
| ධීවර පාරවල් ... | 4,000 0 | 31.12.71 අධිකතා | | 34,273 35 | |
| මතුපිට කානු ... | 25,595 92 | 31.12.71 එකතු වූ ඌනතාවය | | | 3,56,482 24 |
| ණය— | | | | | |
| පුස්තකාල ... | 16 20 | | | | |
| ජල ක්‍රම ... | 34,12,315 0 | | | | |
| සුසාන භූමිය—විල්ලෝරාවත්ත ... | 9,002 14 | | | | |
| විදුලිය අංශය ... | 1,473 17 | | | | |
| මාවත් හා අළුත් වැඩ ... | 77 98 | | | | |
| ක්ෂය ප්‍රමාණ සංචිතය ... | 79,410 40 | | | | |
| | 48,09,620 92 | | | | 48,09,620 92 |

1971 දෙසැම්බර් 31 වන දිනට මොරටු පළාත් ආණ්ඩු සභාවේ වත්කම් හා බැරකම් දක්වෙන ඉහත සඳහන් ලේඛනය මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට නිවැරදි හා සත්‍ය බවට මොරටු පළාත් ආණ්ඩු සභාවේ සභාපති තාන්තුලගේ හාඤුරංසි ජයසුමන ධර්මබන්ධු වන මම දිවුරා සහතික කරමි.

ජයසුමන ධර්මබන්ධු,
සභාපති, මොරටුව නගර සභාව.

මා ඉදිරිපිට දිවුරා අත්සන් කරන ලදී.

පී. එස්. ඩග්ලස් ප්‍රනාන්දු,
මොරටුව පළාත් ආණ්ඩු සභා නියෝජිත හා සමාදාන විනිශ්චයකාර තැන.

73.02.06 දින.

නිවැරදි බවට සහතික කරමි.

මොරටුව පළාත් ආණ්ඩු සභාවේ නියෝජිත.

4–648—72.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

## ගම්පහ පළාත් ආණ්ඩු සභාව

### 1970 ආදායම් හා වියදම් ප්‍රකාශනය

| ආදායම | රු. ශ. | රු. ශ. | වියදම | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදායම් ... ... | | 3,22,254 92 | ඒ.—සාමාන්‍ය වියදම ... ... | | 1,37,232 72 |
| බී.—පොදු මංමාවත් ... ... | | 4,433 60 | බී.—පොදු මංමාවත් ... ... | | 1,44,615 06 |
| සී.—තානායම් සහ අම්බලම්... ... | | 10,889 53 | සී.—තානායම් සහ අම්බලම් ... ... | | 14,603 86 |
| ඩී.—නගර සහා ඉඩම් සහ ගොඩනැගිලි ... | | 9,483 55 | ඩී.—නගර සහා ඉඩම් සහ ගොඩනැගිලි ... | | 38,735 38 |
| ඊ.—මහජන සුවය ... ... | | 1,01,628 49 | ඊ.—මහජන සුවය ... ... | | 2,93,467 52 |
| එෆ්.—පොදු ක්‍රීඩා ... ... | | 47,835 85 | එෆ්.—පොදු ක්‍රීඩා ... ... | | 6,253 11 |
| ජී.—සොහොන් බිම් ... ... | | 1,329 50 | ජී.—සොහොන් බිම් ... ... | | 3,177 0 |
| එච්.—බල්ලන් ලියා පදිංචි කිරීම ... | | 20 0 | එච්.—බල්ලන් ලියා පදිංචි කිරීම ... | | 322 0 |
| අයි.—තරාදි පඩි සහ සේරු ... ... | | 962 60 | අයි.—තරාදි පඩි සහ සේරු ... ... | | 570 42 |
| ජේ.—විදුලිය දෙපාර්තමේන්තුව ... | | 4,68,457 17 | ජේ.—විදුලිය දෙපාර්තමේන්තුව ... | | 3,66,390 38 |
| එම්.—කියවීම් ශාලා ... ... | | 560 80 | එම්.—කියවීම් ශාලා ... ... | | 15,520 13 |
| | | | මුළු වියදම ... | | 10,20,917 58 |
| වෙනත් ලැබීම් | | | වෙනත් ගෙවීම් | | |
| තැන්පත් මුදල් ... ... | 4,73,660 33 | | තැන්පත් ... ... | 4,82,872 97 | |
| අත්තිකාරම් මුදල් ... ... | 2,78,148 77 | | අත්තිකාරම් ... ... | 2,37,641 32 | |
| වෙළඳ පොල ණය මුදල් ... | 2,30,900 0 | | මකුපිට කාණු ක්‍රමය ... ... | 77,983 52 | |
| පුස්තකාල ආධාර ... ... | 750 0 | | වෙළඳ පොල ණය මුදල් ... | 2,30,900 0 | |
| මකුපිට කාණු යෝජනා ක්‍රමය ... | 21,277 86 | | ස්ථිර තැන්පත් (ලංකා බැංකුව) ... | 1,05,701 12 | |
| ක්ෂයවීමේ ගිණුම ... ... | 5,000 0 | | ම.ජ. බැං. ඉ. ගිණුම ... | 41 13 | |
| | | | පුස්තකාල ආධාර ... ... | 700 0 | |
| | | 10,09,736 96 | | | 11,35,840 06 |
| | | 19,77,592 97 | | | 21,56,757 64 |
| | | 3,39,917 93 | | | 1,60,753 26 |
| | | 23,17,510 90 | | | 23,17,510 90 |

ගම්පහ පළාත් ආණ්ඩු සභාවේ 1970 දෙසැම්බර් 31 දිනට දක්වෙන පූර්වෝක්ත ආදායම් හා වියදම් ප්‍රකාශය එම සභාවේ සභාපති, දෙන් ගුණපාල වීරතුංග වන මම මගේ උපස් ම දැනීමේ හා විශ්වාසයේ අන්දමට නිවැරදි හා සත්‍ය ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

ඩී. ජී. වීරතුංග,
ගම්පහ පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

නිවැරදි බවට සහතික කරමි.

කේ. ඇන්. ඕ. ජිනසේන,
අංක 2 කොට්ඨාශයේ නියෝජිත.

1971 ජූනි මස 2 දින මා ඉදිරිපිට දී සහතික කරන ලදී.

ඇම්. එච්. මහරූප්,
සමාදාන විනිශ්චයකාර තැන.

පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
ගම්පහ, 1791.05.31 දී.

## ගම්පහ පළාත් ආණ්ඩු සභාව

### 1970 දෙසැම්බර් 31 දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශනය

| බැරකම් | රු. ශ. | රු. ශ. | වත්කම් | රු. ශ. |
|---|---|---|---|---|
| තැන්පත් මුදල් ... ... | | 1,12,501 49 | අත්තිකාරම් ... ... | 52,019 03 |
| පුස්තකාල සඳහා රජයේ ආධාර ... | | 850 0 | තිර තැන්පත් (ලංකා බැංකුව) ... | 2,39,844 98 |
| තානායම සඳහා රජයේ ආධාර ... | | 750 0 | මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම ... | 1,158 57 |
| මකුපිට කාණු ක්‍රමය සඳහා රජයේ ආධාර ... | | 39,919 67 | මුදල් පොතේ ඉතිරිය ... ... | 1,60,753 26 |
| නිවාස යෝජනා ක්‍රමය සඳහා ආධාර ... | | 24,583 76 | | |
| ක්ෂය සංචිය—විදුලිය කාර්යාංශය ... | | 90,000 0 | | |
| අධිකතා හා ඌණතා ගිණුම | | | | |
| 69.12.31 දිනට අධිකය ... | 2,38,232 49 | | | |
| 1970 ආදායම ... | 9,67,856 01 | | | |
| 1970 වියදම ... | 10,20,917 58 | | | |
| 1970 ඌණතාව ... | 53,061 57 | | | |
| 1970.12.31 දිනට අධිකය | | 1,85,170 92 | | |
| | | 4,53,775 84 | | 4,53,775 84 |

ගම්පහ පළාත් ආණ්ඩු සභාවේ, 1970 දෙසැම්බර් 31 දිනට දක්වෙන පූර්වෝක්ත වත්කම් හා බැරකම් ප්‍රකාශනය, එම සභාවේ සභාපති, දොන් ගුණපාල වීරතුංග වන මම මගේ උපරිම දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

ඩී. ජී. වීරතුංග,
ගම්පහ පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

නිවැරදි බවට සහතික කරමි.

කේ. ඇන්. ඕ. ජී. ජිනසේන,
අංක 2 කොට්ඨාශයේ නියෝජිත.

1971 ජූනි මස 2 වැනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඇම්. එච්. මහරූප්,
සාමාදාන විනිශ්චයකාර තැන.

පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
ගම්පහ, 1971 මැයි 31 වැනි දින.

4–641—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

# අය - වැය ලේඛන

### හිඟුරක්ගොඩ සුළු නගර සභාව

1973 සමාන්‍ය අයවැය ලේඛනය

සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40(1) යටතේ අංක 1 දරණ පරිපූරක වැය ලේඛනය

| | | රු. | ශ. |
|---|---|---|---|
| බී—මංමාවත් | | | |
| 8. දියුණු කිරීම් | ... | 20,000 | 0 |
| 14. බස් නවතන ස්ථාන | ... | 2,000 | 0 |
| සී—සභා ගොඩනැගිලි හා ඉඩම් | | | |
| 4. නඩත්තුව | ... | 1,000 | 0 |
| 7. අළුත් වැඩ ... | ... | 30,000 | 0 |
| ඩී—මහජන සෞඛ්‍ය | | | |
| 5. ජලය සැපයීම | | | |
| (සී) නඩත්තුව | ... | 1,000 | 0 |
| (ඊ) ඉදි කිරීම | ... | 5,000 | 0 |
| | ... | 59,000 | 0 |

1973 පෙබරවාරි 23 දින රැස්වීමේ අංක 9(10) යෝජනාවෙන් සභා සම්මත විය.

ඩී. ආර්. අබේරත්න,
සභාපති.

1973 මාර්තු මස 30 වැනි දින,
ගිඟුරක්ගොඩ සුළු නගර සභා කාර්යාලයේදී ය.

4–589—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

### තලවකැලේ-ලිඳුල නගර සභාව

1973 වර්ෂයේ අංක 1 දරණ පරිපූරක අය වැය ලේඛනය

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. |
|---|---|---|
| ඒ. (බී) නොමිළයේ පාසල් පොත් | 500 | 0 |

1973 අප්‍රේල් 7 දින මාසික රැස්වීමේ අංක 25 දරණ සම්මුතියෙන් සභා සම්මත කර ගන්නා ලදී.

ඊ. වනිගසේකර,
සභාපති,
තලවකැලේ-ලිඳුල නගර සභාව.

1973 අප්‍රේල් මස 10 වැනි දින,
තලවකැලේ-ලිඳුල,
නගර සභා කාර්යාලයේදීය.

4–695—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

---

# දේපල විකිණීම්

### අලව්ව සුළු නගර සභාව

හිඟ වරිපනම් ගාස්තු නොගෙවීම නිසා දේපල විකිණීමයි

1973.01.19 වන දින අංක 43 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීම මෙයින් අවලංගු කරන අතර, මෙහි පහත සඳහන් දිනයන්හි එකී වෙන්දේසිය සිදුකරනු ලැබේ.

1971 දෙසැම්බර් මස 31 වනිදයින් අවසන් වූ වර්ෂය වෙනුවෙන් මීට යාව ඇති උප ලේඛනයේ සඳහන් දේපල සම්බන්ධයෙන් ලැබිය යුතු හිඟ වරිපනම් බදු, අයකර ගැනීමට, තහනම් කිරීම සඳහා වංචල දේපල නොමැති වූ කල්හි, මහ නගර සභා ආඥපනතේ (252 වන අධිකාරිය) 252 වන ඡේදය ප්‍රකාර අලව්ව සුළු නගර සභාවේ ලේකම් වරයා විසින් නිකුත් කරන ලද වරෙන්තුවක බලය පිට තහනම් කරන ලද, (1) කුලී සහ ලාභ (2) දුව සහ උපදින ද්‍රව්‍ය (3) ගෙයි උපකරණ සහ (4) පහත සඳහන් දේපලම, ඒ දේපල වෙනුවෙන් ලැබිය යුතු වරිපනම් බදු සහ වරෙන්තු ගාස්තු යථා කාලයේදී ගෙවනු නොලැබුවහොත්, එකී උපලේඛනයේ සඳහන් දිනයන්හි පෙරවරු 8.00 සිට ආරම්භ කොට එකී දේපල පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

බී. ඒ. ධර්මසේන,
ලේකම්, අලව්ව සුළු නගර සභාව

1973 අප්‍රේල් මස 10 වන දින,
අලව්ව සුළු නගර සභා කාර්යාලයේ දීය.

උපලේඛනය

කොට්ඨාශ අංක 4—කඩ වීදිය

(1973 ජූනි මස 13 වන දින පෙරවරු 8.00ට)

දම්පැලැස්ස පාර : 145
ගිරිඋල්ල පාර ; 167, 169 සහ 175.

කොට්ඨාශ අංක 3 —බරඳවත්ත

(1973 ජූනි මස 14 වෙනි දින පෙරවරු 8.00 ට)

දම්පැලැස්ස පාර : 223, 279/1, 309/10, 337, 359/4, 395, 433/1, 399, 433/3, 138, 142, 286, 324, 334/1 සහ 352.

කොට්ඨාශ අංක 2—අලව්ව

(1973 ජූනි මස 20 වන දින පෙරවරු 8.00ට)

මැණික්වත්ත (ජනරජ මාවත) පාර : 22/1, 22/2 සහ 28.

කුරුණෑගල පාර : 15, $15\frac{1}{1}$, $15\frac{1}{2}$, 17, $17\frac{1}{1}$, $17\frac{1}{2}$, $19\frac{1}{1}$, $19\frac{1}{2}$, 21, 19, $21\frac{1}{1}$, $21\frac{1}{2}$, 23, $23\frac{1}{1}$, $23\frac{1}{2}$, 25, $25\frac{1}{1}$, $25\frac{1}{2}$, 27, $27\frac{1}{1}$, $27\frac{1}{2}$, 29, $29\frac{1}{1}$, $29\frac{1}{2}$, 31, $31\frac{1}{1}$, $31\frac{1}{2}$, 33, 35, $35\frac{1}{1}$, $35\frac{1}{2}$, 35/1, 37, 41.

කොට්ඨාශ අංක 1—මහඔය

(1973 ජූනි මස 21 දින පෙරවරු 8.00 ට)

කුරුණෑගල පාර : 259, 267, 269, 118, 126, 128, 136, 144, 146, 146, 148, 150, 172, 174, 180, 182, 390, 392, 394, 396, 298, 400, 402, 400, 402, 404, 410, 412, 414 සහ 420.

කොට්ඨාශ අංක 5—පරමාඋල්ල

(1973 ජූනි මස 22 දින පෙරවරු 8.00 ට)

ගිරිඋල්ල පාර : 503, 595/4, 278/2 සහ 350.

4–659—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

| | රු. | ශ. |
|---|---|---|
| කෝඩ් නිපදවීම ... ... ... | 10 | 0 |
| කෙදි සායම් කිරීම ... ... ... | 10 | 0 |
| කොකෝවා හෝ වියළි පැපොල් කිරි ගබඩාකර තබා ගැනීම ... ... ... | 10 | 0 |
| සම් භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම ... ... | 50 | 0 |
| පළතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම ... | 50 | 0 |
| කෝපි, ධාන්‍ය වර්ග හෝ මාංශ භෝග, කුළු බඩු හෝ පිටි ඇඹරීම ... ... ... | 35 | 0 |
| යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාංශභෝග කෙටීම ... | 35 | 0 |
| බේකිං පවුඩර් නිපදවීම ... ... | 10 | 0 |
| ඔාජරීන් නිපදවීම ... ... ... | 10 | 0 |
| ගෑස් මැන්ටල් නිපදවීම ... ... | 10 | 0 |
| පොට් නිපදවීම ... ... ... | 10 | 0 |
| ඉටිපන්දම් නිපදවීම ... ... ... | 10 | 0 |
| කපුරු නිපදවීම ... ... ... | 10 | 0 |
| ලියන තීන්ත, අච්චු හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම ... ... ... | 10 | 0 |
| රෙදි සෝදන නිල් නිපදවීම ... ... | 10 | 0 |
| සායම් කුඩු නිපදවීම ... ... ... | 10 | 0 |
| ලාකඩ නිපදවීම ... ... ... | 10 | 0 |
| සුවඳ පුයර නිපදවීම ... ... ... | 10 | 0 |
| පාසැල් රට හුණු නිපදවීම ... ... | 50 | 0 |
| ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම ... ... | 250 | 0 |
| සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටොස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම ... ... | 250 | 0 |
| වැලි කඩදාසි නිපදවීම ... ... ... | 10 | 0 |
| ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම ... ... | 10 | 0 |
| පාසැල් ගල්ලෑලි නිපදවීම ... ... | 50 | 0 |
| සෞඛ්‍ය තුවාකඩ නිපදවීම ... ... | 25 | 0 |
| ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම ... ... | 25 | 0 |
| සෙල්ලම් බඩු නිපදවීම ... ... | 50 | 0 |
| මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තැබීම ... | 10 | 0 |
| ශීතකළ හෝ මාළු ගබඩාකර තැබීම ... ... | 50 | 0 |
| ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම ... | 50 | 0 |
| කපාපු පොල් නිපදවීම ... ... | 10 | 0 |
| මැණික් ගල් කැපීම සහ ඔප දැමීම ... ... | 50 | 0 |
| දිය හුණු, සුදු (වයිටින්) හුණු හෝ හිරියල් නිපදවීම ... | 30 | 0 |
| එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම ... | 5 | 0 |
| ටයර් හෝ ටියුබ් වල්කනයිසින් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම ... ... | 5 | 0 |

## III වැනි කොටස—අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

| | රු. | ශ. |
|---|---|---|
| කලාතු මිනිරන් ශුද්ධ කිරීම ... ... | 10 | 0 |
| රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු (කරදමුංගු) එන්සාල් හෝ කෙදි වර්ග සකස් කිරීම ... | 10 | 0 |
| ඩ්‍රයි ක්ලීන් කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම ... ... | 15 | 0 |
| රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යාම ... ... | 50 | 0 |
| විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම ... ... ... | 25 | 0 |
| තෙල් හෝ සත්ව මේද පැසවීම ... ... | 10 | 0 |
| හුණු පිළිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම ... ... ... | 30 | 0 |
| මැටි බඳුන් ඔප දැමීම ... ... ... | 10 | 0 |
| ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම ස්ථානයක් පවත්වාගෙන යාම ... ... | 25 | 0 |
| මෝරවරල් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම ... | 50 | 0 |
| හොණ්ඩර 3 ට වැඩියෙන් තේ ගබඩාකර තබා ගැනීම ... | 25 | 0 |
| බැටරි චාජ් කිරීම හෝ අලුත් වැඩියා කිරීම ... | 10 | 0 |
| වැල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම ... | 25 | 0 |
| මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යාම ... | 50 | 0 |
| බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම ... | 100 | 0 |
| යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම ... | 250 | 0 |
| වාත්තු මඩුවක් පවත්වාගෙන යාම ... ... | 10 | 0 |
| බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම ... | 10 | 0 |
| ගල් ස්මාරක නිපදවීම ... ... | 10 | 0 |
| පැට්රල්, ඩීසල්, තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩා කොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම ... | 250 | 0 |
| පැට්රල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම ... | 100 | 0 |
| මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යාම ... ... | 100 | 0 |
| පොලිෂ් හෝ ඉඩි වර්ග නිපදවීම ... ... | 25 | 0 |
| කෘෂි රසායනික ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම ... ... | 10 | 0 |
| විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම ... ... | 10 | 0 |
| මදුරු කවා (කොයිල්ස්) නිපදවීම ... ... | 10 | 0 |
| ලී දැව ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම ... ... | 10 | 0 |
| රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම ... | 25 | 0 |
| ගල් තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදන නිපදවීම | 10 | 0 |
| වීදුරු භාණ්ඩ නිපදවීම ... ... | 10 | 0 |
| වීදුරු කැඩපත් නිපදවීම ... ... | 10 | 0 |
| යකඩ තහඩු ගැල්වනයිස් කිරීම ... ... | 10 | 0 |
| පාස්සන ඊයම් නිපදවීම ... ... | 10 | 0 |
| ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම ... ... | 100 | 0 |
| කටු කම්බි නිපදවීම ... ... | 100 | 0 |
| කම්බි ඇණ නිපදවීම ... ... | 100 | 0 |
| කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම ... ... ... | 25 | 0 |
| බෙලෙක් බඳුන්, වාතේ පීප්ප හෝ ගබඩා ටැන්කි නිපදවීම ... ... | 25 | 0 |
| ජී. අයි. බාල්දි නිපදවීම ... ... | 25 | 0 |
| වායු සමන යන්ත්‍ර ශීත කරණ හෝ අධිශීත කරණ (ඩීප්ප්‍රීසර්) නිපදවීම, සර්විස් කිරීම හෝ අළුත් වැඩියා කිරීම ... ... | 250 | 0 |
| කිරීම ... ... ... | 250 | 0 |
| බේරික් ලයිනිං හෝ ක්ලච්ලයිනිං නිපදවීම ... | 250 | 0 |
| යන්ත්‍රෝපකරණ නිපදවීම ... ... | 250 | 0 |
| විදුලි භාණ්ඩ නිපදවීම ... ... | 250 | 0 |
| රබර් කැවුණු කෙඳි වර්ග නිපදවීම ... ... | 250 | 0 |
| සංචායක බැටරි නිපදවීම ... ... | 25 | 0 |
| ඊයම් බැටරි නැවත චාර්ජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම ... ... | 10 | 0 |
| රන් කම් සුන්බුන් වලින් වටිනා ලෝහ නිෂ්කර්ෂණය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම ... | 10 | 0 |
| ට්රැක්ටර් රථ එකලස් කිරීම ... ... | 100 | 0 |
| රේඩියේටර් නිපදවීම ... ... | 25 | 0 |
| විදුලි කර්මාන්ත වැඩපලක්, හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩ පලක් පවත්වාගෙන යාම ... | 25 | 0 |
| වියළි කෝෂ බැටරි නිපදවීම ... ... | 50 | 0 |

04-661—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

### විශේෂ කොමසාරිස් කාර්යාලය, මොනරාගල නගරය

මොනරාගල නගරයේ පාලන සීමාව තුළ ජලභීතිකා රෝගය උවදුර පවතින බැවින් එම පාලන සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ස්ථානයක හෝ පාරක හමුවන දඬාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලෙහිම විනාශ කරනු ලබන බව (476 වන අධිකාරය වන) ජලභීතිකා ආඥා පනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දනුම් දෙමි.

මෙහි සඳහන් දිනයේ සිට හයමසක් ගතවූ පසු මෙම නිවේදනය අවලංගු වන්නේ ය.

ටී. බී. වර්සකෝන්,
මොනරාගල නගරයේ විශේෂ කොමසාරිස්.

1973 අප්‍රේල් මස 7 දින,
මොනරාගල,
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

04-649—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

## කඳාන නගරය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය ඒ ඉදිරියෙන් දක්වා ඇති ස්ථානයේ මස් විකිණීමට ගෝඝාතක බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, එම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධව කඳාන නගර සීමාව ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා විරුද්ධ වන කරුණු දැක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පලවන දින සිට දින 7 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව ගෝඝාතක ආඥාපනතේ 272 වන අධිකාරියේ අංක 7(2) දරණ වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

බී. එන්. එෆ්. මෙන්ඩිස්,
විශේෂ කොමසාරිස්,
කඳාන නගරය.

1973 ක්වූ අප්‍රියෙල් මස 10 වෙනි දින,
කඳාන විශේෂ කොමසාරිස් කාර්යාලයේ දීය.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | ස්ථානය හා වෙළඳාමේ සවභාවය |
|---|---|
| 1. ඒ. ඩී. එම්. පෝල් මහතා | 108/12, දුම්රියපොල පාර, කඳාන. |

මෙම කඩයේ එළුහරක්, එළු, කුකුල් හා ඌරු මස් වෙළඳාම් කළ හැකි බැව් සලකන්න.

04–725—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

## හැඳල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරිය වන) සුළු නගර සභා ආඥාපනතේ 161 වැනි සහ 163 වැනි වගන්ති යටතේ හැඳල සුළු නගර සභාව විසින් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලබන බලපත්‍ර වෙනුවෙන් එහි නිශ්චිතව සඳහන් බලපත්‍ර ගාස්තු 1973 ජනවාරි මස 1 වෙනි දින සිට බල පවත්වන සේ පනවා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ. ඩී. විල්බට්,
සභාපති.

1973 අප්‍රේල් මස 9 වෙනි දින,
හැඳල සුළු නගර සභා කායඹාලයේ දී ය.

#### උපලේඛනය

පහත සඳහන් දැක්වෙන කායඹයන් සඳහා යම් සථානයක් පාවිච්චි කිරීමට බලය ලබාදෙන බලපත්‍රයක් :—

| බලපත්‍රයේ ස්වභාවය | වාර්ෂික බලපත්‍ර ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| (1) අඟුරු සඳහා දැව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම ... | 150 | 0 |
| (2) උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හො. 5 ට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩාකර තබා ගැනීම ... | 25 | 0 |
| (3) මාලු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම ... ... | 25 | 0 |

04–647—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

## 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත

1972 අංක 7 දරණ ගෙවල් කුලී පනතේ 38 (1) වන වගන්තිය යටතේ හබරාදූව ගම්සභා ප්‍රදේශය සඳහා ගෙවල් කුලී මණ්ඩලයක් 1972 ජූලි මස 18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ගරු නිවාස හා ගොඩනැගිලි ඇමතිතුමා විසින් පත්කර ඇති බව මෙයින් නිවේදනය කරමි. එම ගෙවල් කුලී මණ්ඩලයේ රැස්වීම් පවත්වනු ලබන ස්ථානය හබරාදූව ගම්සභා කායඹාලය බවත්, එම ගෙවල් කුලී මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන සියලුම දැන්වීම් හා ඉල්ලීම් 'සභාපති' හබරාදූව ගෙවල් කුලී මණ්ඩලය, හබරාදූව ගම් සභාව, උනවටුන යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු බවත්, එම පනතේ 43 (1) වන වගන්තිය යටතේ සම්පාදිත රෙගුලාසි මාලාවේ 3 වන රෙගුලාසිය අනුව මෙයින් දැනුම් දෙමි.

ස. ලො. ධම්දාස,
සභාපති, හබරාදූව ගෙවල් කුලී මණ්ඩලය.

1973 මාර්තු 28 වන දින,
හබරාදූව ගෙවල් කුලී මණ්ඩලය,
හබරාදූව ගම්සභා කාර්යාලය,
උනවටුන.

04–588—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

## යෝජනාව

### 1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදිතව, 1953 අප්‍රියෙල් මස 10 වැනි දින අංක. 10,517 දරණ රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද, 1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පණතේ IV වැනි කාණ්ඩයේ 6 වැනි වගන්තිය ප්‍රකාර ගාලු දිස්ත්‍රික්කයේ යටලමත්ත ගම් සභාව විසින් නඩත්තු කරනු ලබන පහත සඳහන් පාරවල්වල පහත උප ලේඛණයෙහි සඳහන් ප්‍රමාණයන්ට අධික බර ඇති වාහන ගමනා ගමනය කිරීම තහනම් කළ යුතුයයි 1973 මාර්තු 29 වැනි දින පවත්වන්නට යෙදුනු මාසික රැස්වීමේදී සම්මත වූ බැව් මහජනයාගේ දන ගැනීම පිණිස මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

යෝජනාකරු : අංක. 6—උනන්විටිය, නියෝජිත, පී. ඩී. ජයවර්දන මහතා
ස්ථිරකරු : අංක. 8—කැප්පිටියාගොඩ උතුර නියෝජිත, එච්. ඒ. ධර්මදස මහතා.

මෙයට,

ගම්සභා කායඹාලය,
යටලමත්ත ගම් සභාව,
1973, මාර්තු මස 29 වැනි දින දී ය.

එ. මො. දයාවංශ,
සභාපති.

#### උපලේඛනය

| ගම්සභා කොට්ඨාශය අංකය සහ නම | පාරේ නම | ප්‍රවාහනය කළ හැකි වාහනයේ උපරිම බර ටො. | හො. | කා. |
|---|---|---|---|---|
| 2. උඩවැලිවිටි තලාව ... | තලාව—පන්සල පාර | 2 | 10 | 0 |
| 5. බෙම්බඩ ... | බෙම්බඩ—කිරිමැටිය පාර ... | 2 | 10 | 0 |
| 6. උනන්විටිය ... | එච්. එල්. ඉලේපෙරුම මාවත ... | 2 | 10 | 0 |

04–651—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

## කනදරා කෝරලේ ගම් සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛණයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1973 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කර තිබෙන බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන කනදරා කෝරලේ ගම් සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුලත මා වෙත එවීමට බලය තිබෙන බවද, මස් පිණිස් සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 පරිච්ඡේදය) අංක. 7 (2) දරණ වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම් සහ ලිපිනයන් | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| ආනා. යූෂප්, කටුකැලියාව, ඉහලගම | එළ හරක් මස් ... | කටුකැලියාව |
| ඇම්. රෂීද්, කටුකැලියාව, ඉහලගම ... | එළ හරක් මස් ... | කටුකැලියාව |

යූ. ඇල්. අප්පුහාමි,
සභාපති,
කනදරා කෝරලේ ගම් සභාව.

ගම් සභා කායඹාලය,
මිහින්තලේ, 1973, අප්‍රේල් මස 9 වැනි දින.

04–639—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

## කොළඹ දිස්ත්‍රික්කයේ යක්කල අළුත්ගම්පේරුව ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උප ලේඛනයෙහි නම් සඳහන් අය විසින් එකී උපලේඛනයෙහි සඳහන් ස්ථානයෙහි 1973 වර්ෂයට මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා අවසර පත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, එම අවසර පත්‍රය නිකුත් කිරීම ගැන කොළඹ දිස්ත්‍රික්කයේ-යක්කල අළුත්ගම්පේරුව ගම්සභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවිය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වන අධිකාරිය වන) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳම | ස්ථානය |
|---|---|---|
| එම්. බාවා මොහිදීන්, 58, ආරාමය පාර, දෙමටගොඩ, කොළඹ 9 | හරක් මස් සහ එළුමස් කඩය අංක 1 සහ 2 | යක්කල රදවාන පාර |
| එම්. බාවා මොහිදීන්, 58, ආරාමය පාර, දෙමටගොඩ, කොළඹ 9 | හරක් මස් සහ එළුමස් කඩය අංක 1 | යක්කල ගම්පහ පාර |

1973 අප්‍රේල් 11 දින,
ගම්සභා කාර්යාලය, යක්කල.

ඇම්. ඒ. ඩී. සුමනදාස,
අළුත්ගම්පේරුව ගම්සභාවේ සභාපති.

4–663—73.04.27 දින අංක 57 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය
### 1973

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| මැයි | ... | 73.05.04 සිකුරාද | ... | 73.04.27 සිකුරාද | දවල් 12.00 |
| | | 73.05.11 සිකුරාද | ... | 73.05.04 සිකුරාද | දවල් 12.00 |
| | | 73.05.18 සිකුරාද | ... | 73.05.11 සිකුරාද | දවල් 12.00 |
| | | 73.05.25 සිකුරාද | ... | 73.05.18 සිකුරාද | දවල් 12.00 |
| ජූනි | ... | 73.06.01 සිකුරාද | ... | 73.05.25 සිකුරාද | දවල් 12.00 |
| | | 73.06.08 සිකුරාද | ... | 73.06.01 සිකුරාද | දවල් 12.00 |
| | | 73.06.14 බ්‍රහස්පතින්ද | ... | 73.06.08 සිකුරාද | දවල් 12.00 |
| | | 73.06.22 සිකුරාද | ... | 73.06.14 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | | 73.06.29 සිකුරාද | ... | 73.06.22 සිකුරාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්.
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින.

ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.